2024 - වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

செயல்திறன் மற்றும் நிதி அறிக்கை - 2024

Performance and Financial Report - 2024













දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

மாவட்ட செயலகம் - கொழும்பு

DISTRICT SECRETARIAT - COLOMBO

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

වැය ශීර්ෂ අංක 255

දුරකථන අංක	-	0112 369 134 / 0112 369 136
ෆැක්ස්	-	0112 369 142
වෙබ් අඩවිය	-	colombo.dist.gov.lk
ඊමේල් ලිපිනය	-	ds@colombo.dist.gov.lk

පටුන

අනු අංකය	මාතෘකාව	පිටු අංකය
1.	පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය.....	
1.1	දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම.....	05
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු.....	08
1.3	ප්‍රධාන කාර්යයන්.....	09
1.4	සංවිධාන සටහන.....	10
1.5	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල	
1.5.1	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ මූලික තොරතුරු.....	11
1.5.2	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්.....	12
1.5.3	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබාගෙන ඇති ජයග්‍රහණ.....	13
1.5.4	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මුහුණදීමට සිදුවන අභියෝග.....	18
1.5.5	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිරි ඉලක්ක.....	21
2.	පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (විශේෂ ජයග්‍රහණ, අභියෝග, ඉදිරි ඉලක්ක)	
2.1	විශේෂ ජයග්‍රහණ.....	
2..1.1	ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන.....	26
2.1.2	ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය.....	27
2.1.3	ව්‍යවසාය සංවර්ධනය.....	28
2.1.4	මානව සම්පත් සංවර්ධනය.....	28
2.1.5	පාරිභෝගික ආරක්ෂණය.....	29
2.1.6	සමාජ ආරක්ෂණය.....	29
2.1.7	ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය.....	30
2.1.8	සමාජ සංවර්ධනය.....	30
2.1.9	පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය.....	31
2.1.10	ආගමික හා සංස්කෘතික කටයුතු.....	31
2.2	අභියෝග.....	
2.2.1	ආයතනික පරිපාලන හා මූල්‍යකරණය.....	32
2.2.2.	ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන.....	33
2.2.3	ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය.....	33
2.2.4	ව්‍යවසාය සංවර්ධනය.....	33
2.2.5	මානව සම්පත් සංවර්ධනය.....	34
2.2.6	පාරිභෝගික ආරක්ෂණය.....	34

අනු අංකය		මාතෘකාව	පිටු අංකය
	2.2.7	ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය	35
	2.2.8	සමාජ ආරක්ෂණය	35
	2.2.9	පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය	36
2.3		ඉදිර ඉලක්ක	
	2.3.1	ආයතනික පරිපාලන හා මූල්‍යකරණය	36
	2.3.2	ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන	37
	2.3.3	ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය	37
	2.3.4	ව්‍යවසාය සංවර්ධනය	38
	2.3.5	මානව සම්පත් සංවර්ධනය	38
	2.3.6	පාරිභෝගික ආරක්ෂණය	38
	2.3.7	සමාජ ආරක්ෂණය	39
	2.3.8	ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය	39
	2.3.9	සමාජ සංවර්ධනය	40
	2.3.10	පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය	40
	2.3.11	ආගමික හා සංස්කෘතික කටයුතු	41
3.		පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	
	3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	43
	3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	44
	3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	45
	3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	46
	3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	76
	3.6	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	80
	3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	93
	3.8	විගණකාධිපතිවරයාගේ වාර්තාව	93
4.		පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	95
5.		පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	107
6.		පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	139
	6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	139
	6.2	මානව සම්පත් සංවර්ධනය	139
7.		පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	144

1 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. කොළඹ දිස්ත්‍රික්කය

බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කය උතුරින් කැළණි ගඟෙන් ද දකුණින් පානදුර බොල්ගොඩ ගඟෙන් හා කළුතර දිස්ත්‍රික්කයෙන් ද බස්නාහිරින් ඉන්දියානු සාගරයෙන් ද නැගෙනහිරින් සබරගමුව පළාතෙන් ද මායිම් වී ඇත. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 අතුරින් භූමි ප්‍රමාණයෙන් කුඩාම වන්නේ කොළඹ දිස්ත්‍රික්කයයි. එම භූමි ප්‍රමාණය, වරාය නගර ව්‍යාපෘතියට අයත් වර්ග කිලෝ මීටර 4.47 ද සමඟ වර්ග කිලෝ මීටර 703.47 කි. දිවයිනේ වාණිජ හා වෙළඳ අගනගරය වන කොළඹ නගරය හා පරිපාලන අගනගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරය ද පිහිටා තිබීම මෙම දිස්ත්‍රික්කයේ සුවිශේෂිත්වයට හේතුවක් වී ඇත.

කොළඹ දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 කින් හා ග්‍රාම නිලධාරී වසම් 557කින් යුක්ත වන අතර එයින් වසම් 500ක් නාගරික වසම් වන අතර ඉතිරි වසම් 57 ග්‍රාමීය වසම් වේ. සීතාවක හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට එම ග්‍රාමීය වසම් අයත් වන අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වසම් සියල්ලම නාගරික වසම් වන බව භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේ දී සිදු කරන ලද සමීක්ෂණයකින් හඳුනාගෙන ඇත.

මහා නගර සභා 05 ක්, නගර සභා 05 ක් හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ 13 ක් ද මැතිවරණ බල ප්‍රදේශ 15 ක් ද දිස්ත්‍රික්කයේ පවතී.

දිවයිනේ වැඩිම ජනගහණය සහ ජන ඝනත්වයක් ඇත්තේ ද මෙම දිස්ත්‍රික්කයේ වන අතර 2022 ඇස්තමේන්තුගත ජනගහණය 2,477,922ක් හා ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට 3,545කි. කොළඹ, දෙහිවල හා තිඹිරිගස්යාය වැඩිම ජන ඝනත්වය සහිත කොට්ඨාස වේ. සීතාවක හා පාදුක්ක සාපේක්ෂව අඩු ජන ඝනත්වයක් පෙන්වයි.

දිවයිනේ ඉහළතම ආර්ථික ක්‍රියාකාරිත්වයක් සහිත කොළඹ දිස්ත්‍රික්කය 2022 දී ජාතික දළ දේශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් ලබා දී ඇත. කොළඹ වරාය, පිටකොටුව ආශ්‍රිත තොග වෙළඳපල, නාරාහේන්පිට, රත්මලාන, මීගොඩ හා පිළියන්දල ආදී තොග හා සිල්ලර ආර්ථික මධ්‍යස්ථාන මෙන්ම බැංකු, මූල්‍ය හා රක්ෂණ ඇතුළු වාණිජ ක්ෂේත්‍රයේ ආයතන බහුතරයක ප්‍රධාන කාර්යාල මෙන්ම ආර්ථික මධ්‍යස්ථාන බොහෝමයක් පිහිටා ඇත. එසේම නව ආරක්ෂක හමුදා මූලස්ථානය හා පොලිස් මූලස්ථානය ඇතුළු ආරක්ෂක අංශයේ වැදගත් ආයතනය ද දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ.


මෙම දිස්ත්‍රික්කයේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතීන් අනාගතයේ වැදගත් සන්ධිස්ථාන සටහන් කරනු ඇත. මෙරට ඉදි වූ පළමු අධිවේගී මාර්ගය වන දක්ෂිණ අධිවේගී මාර්ගය,

කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය, නව කැළණි පාලම හා පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘති හා දෙමටගොඩ, නුගේගොඩ ගුවන් පාලම් හා දැනට ඉදිවෙමින් පවතින ගුවන් පාලම් ව්‍යාපෘති මෙරට මාර්ග හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ සුවිශේෂී මංසලකුණු වේ.

ඓතිහාසික කෝට්ටේ හා සීතාවක රාජධානි පිහිටියේ මෙම දිස්ත්‍රික්කයේ වන අතර පුරා විද්‍යාත්මක නටබුන් රාශියක් ගවේෂණය කර ඇත. එසේම දිවයිනේ විශාලතම මිරිදිය ජලාශය වන බොල්ගොඩ වැව, බෙල්ලන්විල-අත්තිඩිය අභයභූමිය හා දියවන්නාව ආශ්‍රිත ඉහළ ජෛව විද්‍යාත්මක වැදගත්කමක් සහිත පරිසර පද්ධතීන් ද පිහිටා ඇත.

ආර්ථික, සමාජයීය, දේශපාලනික හා ඓතිහාසික වශයෙන් කැපී පෙනෙන සුවිශේෂතාවන්ගෙන් සමන්විත මෙම දිස්ත්‍රික්කයේ වර්තමානයේ දී මුහුණ පා ඇති අභියෝග ලෙස, නාගරීකරණය හා අධික ජන ඝනත්වය හඳුනාගෙන ඇත. එමෙන්ම දුගී බවත් ළමා හා මාතෘ මන්දපෝෂණයත් අනෙකුත් දිස්ත්‍රික්කවල මෙන්ම මෙම දිස්ත්‍රික්කයේ ද පවතී. එසේම අධිවේගී මාර්ග ජාලය ද සම්බන්ධ වන ජාතික මාර්ග ජාලයේ ප්‍රමුඛ අංග දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබුණ ද කොළඹ නගරය ඇතුළු ප්‍රධාන නගර ආශ්‍රිතව පවතින මාර්ග තදබදය, පොදු ප්‍රවාහන සේවය ප්‍රමාණවත් නොවන මාර්ග පැවතීම ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභියෝග වේ. අනවසර ඉදි කිරීම් හා ජල බැස්ම අවහිරවීම නිසා ගංවතුර ආපදා තත්ත්වයන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ද දක්නට ලැබේ. කුඹුරු ඇතුළු කෘෂිකාර්මික ඉඩම් වෙනත් කාර්යයන් සඳහා ගොඩ කිරීම දක්නට ඇති අතර වගා කිරීම සඳහා යොදා ගැනීමට හැකි පුරන් කුඹුරු නැවත වගා කිරීමේ අවශ්‍යතාවය ද මතු වී ඇත.

කොළඹ දිස්ත්‍රික් සිතියම



1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

ආයතනය දැක්ම

යහ පාලනයෙන් හා තිරසර සංවර්ධනයෙන් හෙබි ප්‍රමුඛතම දිසාව.....

ආයතනයේ මෙහෙවර

නිර්මාණශීලීව හා නව්‍යශීලීව පවත්නා සම්පත් කළමනාකරණයෙන් ජන ජීවතය සවිබල ගැන්වීමට දිසාව මෙහෙය වීම.


ආයතනයේ අරමුණු

- කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් ක්‍රමයක් පවත්වාගෙන යෑම.
- ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මඟින් කාර්යක්ෂම සේවා සැපයීම සහතික කිරීම.
- ප්‍රතිලාභිමුඛ ආකල්ප, වගකීම, විවක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතිත්වය, විනිවිදභාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුකූල වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරී මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍ය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතුවල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික් කෘෂිකර්ම, පරිසර, ආපදා කළමනාකරණ, වසංගත රෝග මර්ධන, කාන්තා හා ළමා කමිටුවල ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ප්‍රජාවගේ ආර්ථික හා සමාජීය යහපැවැත්මට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 13 දෙනා සමග ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා අධීක්ෂණය කිරීම.
- පරිපාලන කටයුතුවල දී ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.
- දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතනවල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- සියලුම මැතිවරණ කටයුතුවල දී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණවල දී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.


1.4. සංවිධාන සටහන



1.5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.5.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ මූලික තොරතුරු

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ග්‍රාම නිලධාරී වසම්	මුළු භූමි ප්‍රමාණය (ව.කි.මී.)	ජනගහනය (2022)	ජන ඝනත්වය (වර්ග කිලෝ මීටර් 1 ට)
1	කොළඹ	35	22.47	344,615	15,337
2	තිඹිරිගස්යාය	20	24	253,786	10,574
3	කොළොන්නාව	46	28	204,352	7,298
4	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	20	17	115,056	6,768
5	කඩුවෙල	57	88	268,694	3,053
6	මහරගම	41	38	209,401	5,511
7	හෝමාගම	81	121	253,624	2,096
8	කැස්බෑව	73	64	261,435	4,085
9	සීතාවක	68	150	121,326	809
10	පාදුක්ක	46	110	69,579	633
11	දෙහිවල	15	8	94,840	11,855
12	රත්මලාන	13	13	101,816	7,832
13	මොරටුව	42	20	179,398	8,970
දිස්ත්‍රික්කය		**557**	**703.47**	**2,477,922**	**3,522**



1.5.2 කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 න් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

i. ව්‍යවස්ථාපිත කාර්යයන්

- උප්පැන්න/ විවාහ/ මරණ සහතික ඇතුළු පුද්ගල අනන්‍යතාව සම්බන්ධ කාර්යයන්
- ජාතික හැඳුනුම්පත් ලබා දීම හා අනු අත්සන් කිරීම්
- සියලු බලපත්‍ර වර්ග ලබා දීම, ඉඩම් අත්පත් හා ඉඩම් පැවරීම් කටයුතු
- විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ධ කටයුතු

ii. සමාජ සුබසාධන කාර්යයන්

- ගංවතුර ඇතුලු ආපදා සහන කටයුතු
- වැඩිහිටි, ආබාධිත, ගර්භණී හා රෝගාධාර ආදී පුද්ගල ආධාර ලබාදීම

iii. රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන ආදී මූල්‍ය ප්‍රභවයන්ගේ ප්‍රතිපාදන යටතේ පොදු වැසිකිළි, ග්‍රාමීය මාර්ග, කෘෂි මාර්ග හා ඇළවේලි ආදී යටිතල පහසුකම් සංවර්ධනය

1.5.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය %
01.	කොළඹ	100
02.	තිඹිරිගස්‌යාය	
03.	කොළොන්නාව	
04.	පාදුක්ක	
05.	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	
06.	සීතාවක	
07.	දෙහිවල	
08.	රත්මලාන	99
09.	හෝමාගම	98
10.	මහරගම	97
11.	කැස්බෑව	
12.	කඩුවෙල	90
13.	මොරටුව	

1.5.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ළඟා කරගෙන ඇති විශේෂ ජයග්‍රහණ

i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- අන්තර් රාජ්‍ය සේවක නාට්‍ය උළලේදී හොඳම පසුතල නිර්මාණයට අදාළ සම්මානය ලබා ගැනීම.
- දිරිය පිරිස නිවාස වැඩසටහන යටතේ ජයවිමන නිවාස දෙකක් ජනතා අයිතියට පත් කර ඇත.
- හර්බ්ලයින් ආයතනය හා සම්බන්ධ කරන ලද හුණුපිටිය පිවිතුරු කාන්තා සමිතියේ ආයිෂා බීබී මහත්මිය හොඳම අලෙවි නියෝජිත ලෙස සහ කොළඹ අලෙවි කළමණාකරු වශයෙන් සම්මානවලින් පිදුම් ලැබීම.



- මට්ටක්කුලිය ප්‍රංශවත්ත අංක 81/1 A, W. ශ්‍රියාණි මහත්මියගේ වැසි ජලයෙන් යටවන නිවසේ බිම සකසා දීම.
- අධ්‍යාපන ආධාර අවශ්‍ය දරුවන් 200 දෙනෙකු සඳහා පාසල් උපකරණ ලබා දීම.
- ආන්තිකරණයට ලක්වූ කාන්තා මූලික පවුල් 17 ක් සඳහා ස්වයං රැකියා අවස්ථා හා ඊට අදාළ උපකරණ සහිත පහසුකම් සැලසීම.
- දිස්ත්‍රික් දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම්වලින් දිස්ත්‍රික් මට්ටමේ ප්‍රථම ස්ථාන 82 ක් කොට්ඨාසය නියෝජනය කරන ලද දහම් පාසල් 40 විසින් ලබා ගැනීම.
- 48 වන ජාතික මහ ක්‍රීඩා උළෙලේ කැරම් ශූරතාවය දිනා ගැනීම.

ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- සමස්ත දිවයිනෙන්ම ඵලදායිතා සම්මානය, 2 වන ස්ථානයත් කොළඹ දිස්ත්‍රික්කයෙන් 1 වන ස්ථානයත් ලබා ගැනීම.
- කාර්යාල පරිශ්‍රය තුළ සෑම මසයකම ව්‍යවසායක පොළ සහ නුගේගොඩ ගුවන් පාළම අසළ අළෙවි පොළවල් පැවැත්වීම.
- විද්‍යුත් මධ්‍යස්ථානය මගින් යොමු කරන ලද කොට්ඨාසයේ ව්‍යවසායිකාවන් දෙදෙනෙක්හට යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකකරණය GMP (Good Manufacturing Product) තත්ව සහතික ලබා ගැනීම.



- ආතර් C. ක්ලාක් මධ්‍යස්ථානය මගින් පිරිනමන පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ ඉලෙක්ට්‍රොනික යන පාඨමාලාවලින් සහතිකපත්‍ර ලබා ගෙන කොට්ඨාසයේ 6 දෙනෙක් රැකියා ගතවීම.
- ත්‍රීරෝද රථ රියදුරන් 13 දෙනෙක් සඳහා අමතර ආදායම් මාර්ගයක් ලෙස Electronic සහ Hair Cutting පුහුණුව ලබා දී ඊට අදාළ උපකරණ නොමිලේ ලබාදීම.

- දීර්ඝකාලීන බදු ඉඩම්වල මුදල් රු.මි. 63.73 ක් අයකර ගැනීම.
- දකුණු කොළඹ සහ බොරැල්ල ප්‍රජාමූල සමෘද්ධි බැංකු මගින් රු.මි. 77 ක ආදායමක් ලබා රු.මි. 14.74 ක ශුද්ධ ලාභයක් ලබා ගැනීම සහ රු.මි. 8 ක පොළී මුදලක් වර්ධනය කර ගැනීම.

iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- සේවාවන් ලබා ගැනීමට පැමිණ සිටින මහජනතාව කාර්යාලය තුළ රැදී සිටින ප්‍රදේශයේ ගතවන කාලය අර්ථවත් ලෙස ගෙවා දැමීමට එම ස්ථානයේ රූපවාහිනී යන්ත්‍රයක් සවි කිරීම.
- කාර්යාලය තුළ ආරක්ෂක කැමරා පද්ධතියක් (cctv), අන්තර් දුරකථන පද්ධතියක්, සවි කිරීම.



- සමෘද්ධි අංශය හරහා ජංගම අලෙවි පොළවල් 13 ලබාදීම.
- කාර්යාලීය රථගාල දෙවන අදියර සංවර්ධනය කිරීම.
- ගොතටුව සමාද්ධි බැංකුවෙහි අත්පොත් තැබීම අවසන් කොට යාන්ත්‍රීය ක්‍රියාවලිය පමණක් භාවිතා කිරීම.
- බස්නාහිර පළාත් වැඩිහිටි තරඟාවලියේ නව නිර්මාණ නර්තන අංශයෙහි ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.

iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 176 ක්, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 13 ක් සහ බස්නාහිර පළාත් සභා අරමුදල් යටතේ ව්‍යාපෘති 51 ක් 100% භෞතික ප්‍රගතියක් සහිතව අවසන් කිරීම.



- රාජගිරිය ගුවන්පාලම ආරම්භ වන ස්ථානයේ විමධ්‍යගත අයවැය අරමුදල්, බස්නාහිර පලාත් සභා අරමුදල් යොදවා ස්වංරැකියා අළෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීම.
- මිරිහාන - ජුබිලිකණුව මංසන්ධිය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව වන්දි ගෙවීම් කටයුතු 100% කින් අවසන් කිරීම.



- කිරුළපණ - ගොඩගම මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 90% ක් අවසන් කිරීම හා එහි වන්දි ගෙවීම 50% අවසන් කිරීම.
- සූර්ය පැනල පද්ධතියක් කාර්යාල පරිශ්‍රය තුළ සවිකිරීම.

v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2024 වර්ෂය තුළ තෙවතාවක් ගංවතුර හේතුවෙන් පීඩාවට පත් වූව ද කොට්ඨාශය තුළ පුරන් කුඹුරු අක්කර 15 ක් පමණ අස්වැද්දීමට හැකිවීම.
- විදාතා සම්පත් මධ්‍යස්ථානය මගින් ව්‍යවසායකයින් 30 කට අධික ප්‍රමාණයක් බිහිකර අපනයන කටයුතු සඳහා ව්‍යවසායකයන් 4 දෙනෙකු යොමු කිරීම.
- නිලධාරීන් විසින් රාජකාරියට පරිභාහිර වූ ස්වකීය රංගන හා ගායන කුසලතාවයන් එළිදක්වමින් සංවිධානය කරන ලද රූ සර ප්‍රභා ප්‍රසංගය සාර්ථකව අවසන් කිරීම.
- මධ්‍යම රජයේ හා පළාත් සභා අරමුදල් මගින් රු.මි. 225.2 ක සංවර්ධන ව්‍යාපෘති 344 ක් සාර්ථකව නිම කිරීම.

vi. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- සුළු පරිමාණ හෝ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් බිහි කිරීම.
- ආන්තීකරණයට ලක්වූ කාන්තාවන් ස්වයං රැකියා සඳහා සවිබල ගැන්වීම.
- විමධ්‍යගත/ විමධ්‍යගත විශේෂ මන්ත්‍රී ප්‍රතිපාදන/ පළාත් සභා/ ග්‍රාමීය මාර්ග/ රේඛීය අමාත්‍යාංශ සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම.
    - ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරී වසමේ රබර්වත්ත පාරේ 1 වෙනි පටුමග වරිපණම් අංක 60 දරණ නිවස අසල මීටර් 100 ක් ඉදිරියට කොන්ක්‍රීට් කිරීම.
    - ප්‍රගතිපුර ග්‍රාම නිලධාරී වසමේ ශීලවනාරාමය සංවර්ධනය කිරීම.

vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- නව කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රයෙහි රාජකාරි කටයුතු ආරම්භ කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත ග්‍රාම සංවර්ධනයේ පුහුණු මධ්‍යස්ථානය NVQ Level මට්ටම දක්වා පාඨමාලා පැවැත්වීමට හැකි ලෙස භෞතික සංවර්ධන කිරීම.
- ග්‍රාම නිලධාරී වසම් සඳහා නව සේවා පියස් ඉදිකර දීම.

viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- සමාජ ආරක්ෂණය, රක්ෂණය සඳහා ඉහළ බඳවා ගැනීම් ප්‍රමාණයක් සිදුකර දිස්ත්‍රික්කයෙන් දෙවන ස්ථානයද, මූල්‍ය ඉලක්කය සපුරාලීම මත දිස්ත්‍රික්කයෙන් තෙවන ස්ථානය ද ලභා කර ගැනීම.
- ඊ - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ දත්ත එක්රැස් කිරීමේ ප්‍රගතිය අනුව, වැඩිම පරිපාලන ඒකක සංඛ්‍යාවක් නිම කිරීම.
- "ග්‍රාම ප්‍රභා" උළෙල දී හොඳම ග්‍රාම සංවර්ධන සමිති තේරීමේ තරගයේ
  - දිස්ත්‍රික්කයේ හොඳම ග්‍රාම සංවර්ධන සමිතිය ප්‍රථම ස්ථානය/ බස්නාහිර පළාත් හොඳම ග්‍රාම සංවර්ධන සමිති තෙවන ස්ථානය - බටකැත්තර දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය
  - දිස්ත්‍රික්කයේ හොඳම ග්‍රාම සංවර්ධන සමිතිය තෙවන ස්ථානය - පැපිලියාන බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය
  - ග්‍රාම සංවර්ධන සති වැඩසටහන පළාත් දෙවන ස්ථානය - හොන්නන්තර දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය ජයග්‍රහණ ලබා ගැනීම.
- විස්කම් ප්‍රභා මැහුම් තරඟාවලියේ පැච්වර්ක් අංශය, එම්බ්‍රොයිඩර් අංශය, අත්කම් අංශය, ගෙතුම් අංශය, මැහුම් අංශය යන අංශවලින් ජයග්‍රහන ලබා ගැනීම.

ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- උරුමය වැඩසටහන යටතේ සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් 306 දෙනෙකු වෙත නිදහස් දීමනා පත්‍ර සකසා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- UN Women සහ Chrysalis යන ආයතන අනුග්‍රහයෙන් කාන්තා ව්‍යවසායකයින් සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් මෙහෙයවීම.
- ස්වභාවික ආපදා හේතුවෙන් පීඩාවට පත් පවුල් 3089 ක පුද්ගලයින් 11265 දෙනකු සහ හානි වූ ව්‍යාපාර 534 ක් සඳහා කඩිනම් සහන සැලසීම හා වන්දි ලබාදීම (රු. මි. 5.1)

x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කාර්යාලයේ හා මලගල මහා විද්‍යාලයේ පැවැති ජංගම සේවා වැඩසටහන් මඟින් හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් 100 ගෙන් ලද අයදුම්පත්, හැඳුනුම්පත් සැකසීම සඳහා යොමු කිරීම.
- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා වාර්ෂික ඉලක්කය වන 95 ඉක්මවා බඳවා ගැනීම් 112 ක් සිදු කිරීම. (මූල්‍යමය වටිනාකම රු. 1,010,843.00)

- රු.මි 24.13 ක මුදලක් වැයකර ආගමික මධ්‍යස්ථාන , පාසල්, පෙර පාසල්, සමිති සමාගම් හා ස්වයං රැකියා කරන පුද්ගලයින් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.

xi. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කොහුවල මංසන්දියේ පැවති අධික රථවාහන තදබදයට පිළියමක් ලෙස ඉදි කිරීම් ආරම්භ කළ කොහුවල නව ගුවන් පාලමේ වැඩ අවසන් කිරීම.
- කොට්ඨාසයට අයත් කරගම්පිටිය විජය විද්‍යාලයේ වගා නොකළ පර්වස් 75 ක භූමිය තුළ වගා කටයුතු ආරම්භ කිරීම.
- පාමංකඩ - හොරණ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා කිරුලපන - ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය පටන් ගැනීම සහ වන්දි මුදල් ලබාදීම ආරම්භ කිරීම.

xii. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් නිවාස 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු 200,000 බැගින් ලබා දීම.
- ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා සාමාන්‍ය අළෙවි වෙළඳ පොළවල් 48 ක් සහ විශේෂ අළෙවි වෙළඳ පොළවල් 02 ක් පැවැත්වීම.
- සමෘද්ධි නිවාස වැඩසටහන යටතේ රන්විමන නිවාස 01 ක් අලුතින් ඉදිකිරීම සහ ජයවිමන යටතේ නිවාස 2 ක් අලුත්වැඩියා කිරීම.

xiii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ විල්ලෝරවත්ත වඩුමඩු හිමියන්ගේ සමිතිය මඟින් මේ වසරේදී ඉහළ ආදායම් මට්ටමක් උපයා ගෙන තිබීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක මට්ටමේ සිටි RS බැට් නිෂ්පාදන ආයතනය ජාත්‍යන්තර මට්ටම දක්වා යොමු කිරීම.
- කොට්ඨාසයේ බිම්මල් නිෂ්පාදන හා බිම්මල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන ක්‍රම හඳුන්වා දී ඊට අදාළ උපකරණ, ගිණුම් පුහුණුව, පිරිවැයකරණය, හා online marketing ක්‍රමය පිළිබඳ පුහුණුව ලබා දී සාර්ථක ව්‍යවසායකයින් 20 ක් බිහි කිරීම.

1.5.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුහුණ දෙන ලද අභියෝග

i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ක්ෂේත්‍ර ගත රාජකාරී කිරීමට ප්‍රවාහන පහසුකම් නොමැති වීම.
- මත්ද්‍රව්‍ය අධිකව භාවිත වන ප්‍රදේශවල ප්‍රජා විශෝධන කටයුතු, ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා යාමේ දී ආරක්ෂාව පිළිබඳ අවධානමකට මුහුණදීමට සිදුවීම.
- හදිසිඳ ආපදා තත්වයකදී අදාළ ස්ථාන කරා ළඟාවීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම්වල අඩුපාඩු පැවතීම.
- කොට්ඨාසයේ ක්‍රීඩක, ක්‍රීඩකාවන්ට පෝෂණ දීමනා නොලැබීම.
- ග්‍රාම නිලධාරී හිඟය. (වසම් 35 ට ග්‍රාම නිලධාරීන් 25 දෙනෙකු පමණකි)
- ස්වාභාවික ආපදාවන්වලට ලක් වූ ජනතාවට වන්දි ගෙවීම් කටයුතු සිදු කිරීමේ දී අනවසර පදිංචිකරුවන් රාශියක් සිටීම.

ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- සේවාලාභීන් විශාල සංඛ්‍යාවකට දෛනිකව උප්පැන්න සහතික, මරණ සහතික හා ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන මානව සම්පත් හා භෞතික සම්පත් සපුරා ගැනීම.



- අධික නාගරීකරණය සහ ජනගහනය අධික කොට්ඨාසයක් බැවින් සුභසාධන ප්‍රතිලාභ ලබාදීමේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ගැටලු ඇතිවීම.
- රාජ්‍ය නොවන සංවිධානයකින් හෝ යම් සංවිධානයකින් ආධාර අරමුදල් ලබා දෙන විට ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සුදුසුතම ප්‍රතිලාභීන් තෝරා ගැනීමට සිදුවීම.
- බහුවාර්ගික ජනතාව වෙසෙන කොට්ඨාසයක් බැවින් සන්නිවේදන කටයුතුවලදී භාෂාමය ගැටලු ඇතිවීම.

iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- වර්ෂය තුළ කොට්ඨාසය තෙවතාවක් දැඩි ගංවතුර තත්වයකට පත්වීම.
- ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී කටයුතු ද සමඟ සියලු සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම.
- කාර්යමණ්ඩල පුරප්පාඩු. (ගණකාධිකාරී, කළමණාකරණ සහකාර, ග්‍රාමනිලධාරී, කාර්යාල කාර්ය සහයක)

iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කාර්යාලීය කටයුතු සඳහා යාවත්කාලීන මෘදුකාංග සහිත දත්ත පද්ධති සකස් කිරීම හා අඛණ්ඩ අන්තර්ජාල පහසුකම් සලසා ගැනීම.
- අත්‍යාවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා ගැනීම.
- කාර්යාලීය හා ක්ෂේත්‍ර නිලධාරීන්ට තොරතුරු තාක්ෂණය හා නව මෘදුකාංග භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පුහුණු අවස්ථා ලබාදීම.

v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- නිරන්තර ගංවතුර හේතුවෙන් පීඩාවට පත්වන ජනතාව ඉන් මුදවා ගැනීම හා කෘෂිකාර්මික බිම් හා අනෙකුත් වගාවන්ට සිදුවන අලාභහානි වලක්වා ගැනීම.
- වන සතුන් (වඳුරන් හා රිලවුන්ගෙන්) සිදුවන වගා හානි වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- කොට්ඨාශයේ අඩු ආදායම්ලාභී ජනතාව ආදායම ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන ක්ෂේත්‍රවලට යොමු කරවීම.
- ළමා හිමිකම් ප්‍රවර්ධනය හා නව යොවුන් පුරවැසියන් මුහුණදෙන සමාජ ගැටලු සඳහා පිළියම් යෙදීම.

vi. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපෘති හඳුනා ගැනීමට ලබාදෙන කාලය ප්‍රමාණවත් නොවීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අනවශ්‍ය කඩිනම් බව නිසා සංශෝධනය කිරීමය සිදුවීම ඵලදායීතාවයට බාධාවක් වීම.
- තොරතුරු පද්ධති භාවිතා කෙරෙන විෂයන් හි දී පවතින තාක්ෂණික ගැටළු හා උපදෙස් සඳහා කඩිනම් විසඳුම් නොලැබීම.
- රාජ්‍ය යාන්ත්‍රණය චක්‍රලේඛ/ උපදෙස් මගින් දැනුවත් වීමට ප්‍රථම මාධ්‍ය හා සමාජ ජාලා මගින් දැනුවත් වීම නිසා මහජන විරෝධයන් ඇතිවීම.

vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම.
- ආර්ථික ගැටළු හමුවේ පීඩාවට පත්වන හා රැකියා අහිමි වන පුද්ගලයින්ට ජීවනෝපාය මාර්ග සකස් කර දීම.
- ඉලෙක්ට්‍රොනික පද්ධති මෙහෙයුම් යන්ත්‍ර ස්ථාපිත කිරීම.
- නව්‍ය ක්ෂේත්‍රවල ඌන ධාරිතා සංවර්ධනය.

- කාර්යාලීය නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ හා මෘදුකාංග පිළිබඳ දැනුම සීමිත වීම.

viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- වාහන ආදායම් බලපත්‍ර ලබාදෙන ස්ථානයේ සහ රෙජිස්ට්‍රාර් අංශයේ ඉඩකඩ ඉතා සීමිත වීම.
- සීමිත මානව හා භෞතික සම්පත් කළමනාකරණය කරමින් නව තාක්ෂණයන් සමඟ යාවත්කාලීන වූ මෘදුකාංග සහිත දත්ත පද්ධති නිර්මාණය කිරීම.

ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කාර්යාලය තුළ ගබඩා පහසුකම් සීමිත වීම.
- කාර්යාල සහ ක්ෂෙත්‍ර නිල්ධාරීන්ගේ පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම යාවත්කාලීන නොමැති වීම.
- සහකාර ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී සහ කාර්යාල කාර්ය සහයක යන ධූරයන් පුරප්පාඩු වීම.

x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- ගංවතුර, නායයෑම් වැනි ස්භාවික ආපදාවන්ට බහුලව ලක්වීම.
- කාර්යාලය තුළ ගබඩා පහසුකම් සීමිත විම.

xi. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල



- වසර 12 ක ලිපිගොනු තැන්පත් කර තැබීම සඳහා ස්ථානයක් නොමැතිවීම.
- දෛනිකව සේවාවන් ලබාගැනීමේ පැමිණෙන ජනතාවගේ වාහන නවතා තැබීමට කාර්යාලීය රථගාලක් නොමැතිවීම.
- දෙහිවල මංසන්ධියේ පවතින අධික වාහන තදබදය හේතුවෙන් සේවා ස්ථානය වෙත පැමිණීමේදී නිලධාරීන්ට හා මහජනතාවට දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවීම.

xii. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- දැනට භුදුන්වා දී ඇති හා භාවිතා කරනු ලබන දත්ත පද්ධති වල ඇති දෝෂ හා සාර්ථක අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- ක්ෂේත්‍රගත නිලධාරීන් සතුව සමීකෂණ හා තොරුතුරු රැස් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ප්‍රමාණවත් නොවීම.
- කාර්යාලයේ විදුලි පරිපථයේ දෝෂ හා විදුලි පරිභෝජනය වැඩවීමේ දී පවතින විදුලි ධාරිතාව ප්‍රමාණවත් නොවීමෙන් හදිසි ගිනි ගැනීම් ඇතිවීම.

- කාර්යාලයේ පවතින සීමිත තාක්ෂණික උපකරණ හා අන්තර්ජාල පහසුකම් භාවිතා කරමින් පරිගණක දත්ත පද්ධති සකස් කිරීම.
- කාර්යාලයේ පවතින සීමිත ඉඩකඩ කළමනාකරණය කර ගනිමින් කාර්යාලීය නිලධාරීන්ට පහසුකම් සැලසීම හා සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

xii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කාර්යාලයේ ඉඩ පහසුකම් අවහිර වන අයුරින් පැවති බාධාවන් සහිත කොටස් ඉවත් කර සේවාලාභීන්ගේ පහසුව වැඩි දියුණු වන අයුරින් කාර්යාල උපකරණ ස්ථාපිත කිරීම
- අපහසුතා මධ්‍ය යේ භාවිතා කරනු ලැබූ ශ්‍රවණාගාරය වායු සමනය කර පහසුකම් සහිතව නවීකරණය කිරීම.

1.5.6 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිරි ඉලක්ක

i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- නව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම.
- මෙහෙයුම් මැදිරිය සකස් කිරීම.
- දේශීය හස්ත කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා තරුණ තරුණියන් 15 ක් පුහුණු කිරීම.
- කොට්ඨාසයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ හැකි ස්ථාන 2 ක ව්‍යාපාර අවස්ථා 10 ක් සංවර්ධනය කිරීම.
- කොට්ඨාසය තුළ අබලන් වී ඇති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස 08 ක් ප්‍රතිසංස්කරණය කිරීම.
- අබලන් වී ඇති පොදු වැසිකිළි පද්ධති 50 ක් ප්‍රතිසංස්කරණය කිරීම.
- අඩු ආදායම්ලාභී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් හා ළමුන් 280 ක් සඳහා ආධාර, උපකරණ ලබා දීම.
- සිරස් හා තිරස් අවකාශවල නාගරික ගෙවතු ආරම්භ කිරීම සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීමට ප්‍රතිලාභීන් 240 ක් සඳහා වැඩසටහන් 12 ක් පැවැත්වීම.

ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- මහජනතාවට උපරිම සේවයක් ලබා දී දිස්ත්‍රික්කයේ සංවර්ධනය අතින් ප්‍රමුඛතම කොට්ඨාසය බවට පත් කිරීම.
- අඩු ආදායම්ලාභී ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ පවුල් 300 ක් සවිබල ගැන්වීම.

- සුළු හා මධ්‍ය පරිමාණ නව ව්‍යවසායකයින් සහ දැනට ව්‍යවසායකත්ව කටයුතුවල නිරතවන ව්‍යවසායකයින් 35 දෙනෙකුගේ ආදායම ඉහළ නැංවීමට වෙළඳපොල අවස්ථා ඇති කිරීම.
- රැකියා විරහිත තරුණ තරුණියන් 575 ක් වෘත්තීය මාර්ගෝපදේශනයට යොමු කර රැකියා ගත කිරීම.
- කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 450 සඳහා සමාජීය, ආර්ථික, මානසික සුභසාධන වැඩසටහන් පැවැත්වීම.

iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- හැඳුනුම්පත් නොමැති වැඩිහිටි පුද්ගලයින් සඳහා නව හැඳුනුම්පත් සැකසීමට ජංගම ක්‍රියාවලියක් ආරම්භ කිරීම.
- කාර්යාලයේ ගබඩා ධාරිතාවය වැඩි කිරීම.
- විශ්‍රාමික වැඩිහිටියන්ට පහසුවෙන් ලභා විය හැකි පරිදි විශ්‍රාම වැටුප් අංශය පහළ තට්ටුවේ ස්ථාපිත කිරීම.
- ගර්භනී මවුවරුන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම සඳහා පෝෂණ මල්ල ලබා දීම තව දුරටත් සක්‍රීය ලෙස පවත්වාගෙන යාම.

iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- අස්වැසුම 02 අදියර සාර්ථකව ඉටු කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ නව ව්‍යවසායකයින් 30 දෙනෙකු සඳහා වෙළඳපොල අවස්ථා ඇති කිරීම.
- විවිධ අරමුදල් මූලාශ්‍රවලින් කොට්ඨාශයට වෙන් වන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීම.



- අඩු ආදායම්ලාභී පවුල් 650 ක් ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සවිබල ගැන්වීම.

v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කෙටිකාලීනව ගංවතුර තර්ජනය පාලනය කිරීම හා දීර්ඝ කාලීන ලෙස ස්ථිරසාර විසඳුමක් කරා යොමු වීම.
- රජයේ නව ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක වන Clean Sri Lanka වැඩසටහන සාමූහික සහභාගිත්වයෙන් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම.



- කොට්ඨාසයේ ස්වයං රැකියාවල නියුතුවූවන්ගේ නිෂ්පාදන, අපනයනය සඳහා ප්‍රවර්ධනය.
- පුරන් කුඹුරු ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීම හා කොට්ඨාසයේ භූමිය තිරසාර හා ඵලදායී ලෙස කෘෂිකාර්මික හා

කාර්මික නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කර ගැනීම.

- කොට්ඨාසයේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් ඉන් මුදවා ගැනීම සඳහා පූර්ණ උපදේශන සේවාවන් ලබාදීම.
- කැළණි ගඟ, වැව් හා දිය කඩිති ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම.

vi. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- E POP වැඩසටහන යටතේ ලියාපදිංචි සහතික 200ක් වත් නිකුත් කිරීමට සැලසුම් කිරීම, 2024 දෙසැම්බර් සිට සෑම උපතක්ම දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කොට පවත්වා ගැනීම හා 2021 සිට මරණ සහතික දත්ත පද්ධතියට ඇතුළත් කිරීම.



- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව/ ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවල දී ඉදිරිපත් වන මහජන ගැටළු සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.
- මහජනයාට සුහදශීලී කාරුණික සේවා සැපයීම උදෙසා නිලධාරීන් තුළ ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනයට පුහුණු සැලැස්ම යාවත්කාලීන කිරීම.

vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- නව කාර්යාල පරිශ්‍රය සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සපයා ගැනීම හා භෞතික සංවර්ධන කටයුතු අවසන් කිරීම.



- නව සේවා පියස් 05 ක් ඉදිකිරීම.
- මුව ගැටළුව පාලනයට ඵලදායී විසඳුම් ලබාදීම.
- කාර්යාලයීය ලිපි ලේඛණ කළමනාකරණයේදී මෘදුකාංග දත්ත පද්ධති හරහා සිදු කිරීම.

viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- පෝෂණ හා මනෝ සමාජීය වැඩසටහන් මාසිකව ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන, ඇසුරුම්කරණය, අලෙවි ප්‍රවර්ධනය, කුඩා ව්‍යාපාර කළමණාකරණය, මූල්‍ය සාක්ෂරතාව යන ක්ෂේත්‍රයන්හි පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- පුරන් වූ කුඹුරු නැවත අස්වැදීමේ වැඩසටහන් හා ඌන උපයෝජිත ඉඩම් වගා කිරීමේ වැඩසටහන් වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- විවිධ අරමුදල් මූලාශ්‍රවලින් කොට්ඨාශයට වෙන්වන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීම.

ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 10 දෙනකු සඳහා නිවාස ලබාදීම.

- අස්වැසුම වැඩසටහන සඳහා අයදුම් කළ නිවාස 3387 ක් සමීක්ෂණය කිරීම.
- ඊ පොපියුලේෂන් වැඩසටහන යටතේ ජාතික උප්පැන්න ලබාදීම ආරම්භ කිරීම.
- කොට්ඨාසයේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ආර්ථික හා සමාජීය වශයෙන් පසුබෑමට ලක්ව සිටින ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- අස්වැසුම වැඩසටහන සඳහා අයදුම් කරන ලද නිවාස 1618 ක් සමීක්ෂණය කිරීම.
- ඊ පොපියුලේෂන් වැඩසටහන යටතේ ජාතික උප්පැන්න ලබා දීමේ කටයුතු සිදු කිරීම.
- විවිධ අරමුදල් මූලාශ්‍රවලින් කොට්ඨාශයට වෙන්වන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීම.

xi. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා සැලසුම් කරන ලද නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල කටයුතු සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහාය ලබාගැනීම.
- මුහුදුබඩ මාර්ගයේ තෙවන අදියර දෙහිවල දුම්රිය ස්ථානය අසළ සිට ඕබන් පෙදෙස දක්වා කොටසෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පියවර සැලසුම් කිරීම.

xii. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- ආර්ථික, සාමාජීය, පාරිසරික සංවර්ධන අංශ අතරින් දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතම කොට්ඨාශයක් බවට පත්වීම.
- සුළු හා මධ්‍ය පරිමාණ නව ව්‍යාවසායකයින්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් 10 ක් පැවැත්වීම හා ඔවුන්ට වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.
- විවිධ අරමුදල් මූලාශ්‍රවලින් කොට්ඨාශයට වෙන්වන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීම.

xiii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- මොරටුව දකුණ කලාපයේ නව ගාලු පාරත් පැරණි ගාලු පාරත් අතර අතුරු මාර්ග රැසක් වැසි ජලයෙන් යටවීම වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම
- බොල්ගොඩ ගඟ පවිත්‍ර කිරීම හා ආර්ථිකමය වශයෙන් ඵලදායී වන සංචාරක ගමනාන්තයක් දක්වා එම ජලාශය සංවර්ධනය කිරීම.
- ජපන් ජබර ශාක යොදා ගනිමින් අත්කම් කර්මාන්තය සඳහා ව්‍යවසායකයින් බිහි කිරීම.
- බොරුපන මංසන්දියේ සිට කුරුස හන්දිය දක්වා ගාලු පාර මැද දූපතේ පාරිසරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

2 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ළඟා කර ගත් **විශේෂ ජයග්‍රහණ**, විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් කාර්ය ඉටු කිරීමේ දී මුහුණ පෑ **අභියෝග** හා **ඉදිරි ඉලක්ක** මෙම පරිච්ඡේදයේ දක්වා ඇත.

- ආයතනික, පරිපාලන හා මූල්‍යකරණය
- ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන
- ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය
- ව්‍යවසාය සංවර්ධනය
- මානව සම්පත් සංවර්ධනය
- පාරිභෝගික ආරක්ෂණය
- සමාජ ආරක්ෂණය
- ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය
- සමාජ සංවර්ධනය
- පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය
- ආගමික හා සංස්කෘතික

2.1 විශේෂ ජයග්‍රහණ

2.1.1 ආයතනික, පරිපාලන හා මූල්‍යකරණය

- 2024 විගණන සැලැස්මට අනුව විගණන පරීක්ෂණ 42 ට අමතරව විගණන පරීක්ෂණ 01 ක් සිදු කිරීම.
- හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල මහල් තුනක වැඩ අවසන් කර කාර්යාල කටයුතු ආරම්භ කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය අධීක්ෂණ කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කිරීම.
- රාජ්‍ය ආයතනවල වැඩි දියුණු කළ යුතු ඵලදායීතා ක්‍රියාවලීන් 30 ක් වැඩි දියුණු කිරීම.
- ඵලදායීතාවය හා නව්‍යකරණය පිළිබඳ මූලික සහතිකපත්‍ර පාඨමාලා 2 ක් සිදු කිරීම.
- 2017.01.26 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදි සාකච්ඡා කරන ලද කරුණු නවයකින් කරුණු හතක් නිරවුල් කර තිබීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගබඩාවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ගබඩා ද්‍රව්‍ය හා ආකෘති පත්‍ර නිකුත් කිරීම සඳහා ගබඩා කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

2.1.2 ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන

- ජන හා නිවාස සංගණනය - 2024 ලැයිස්තු ගත කිරීමේ අදියර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ම සාර්ථකව නිම කිරීම.

- වර්ෂයට අදාළව කොළඹ දිස්ත්‍රික්කය තුළ ශ්‍රමබල සමීක්ෂණ නියැදි 240 ක, වී අස්වනු සමීක්ෂණ නියැදි 78ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8 ක මිල රැස් කිරීම සම්බන්ධ තොරතුරු සාර්ථකව රැස් කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි තැපෑල සඳහා එකම ආකාරයේ දත්ත පද්ධතියක් හඳුන්වාදීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය උත්සව හා විශේෂ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන ආරාධනා පත්‍ර, සහතික පත්‍ර, පසුතල නිර්මාණ ආදිය සකසා දීම මගින් රාජ්‍ය වියදම් අවම කර ගැනීම.
- සූර්ය බලශක්තිය ප්‍රචලිත කිරීමේ අරමුණින් සූර්ය පැනල ලබා දීමේ ව්‍යාපෘති 47 ක් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා අනුකමිටු පවත්වා කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව මුහුණ දෙන ගැටලු විසඳීම.
    - හෝමාගම උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගළගාදෙණිය ඇළට වැසිකිළි අපද්‍රව්‍ය මුදා හැරීම.
    - **ඔරුගොඩවත්ත සිට කඩුවෙල අධිවේගී මාර්ගය දක්වා ඇති පැරණි** ජලනළ ඉවත් කර අළුතින් එළීමේ ව්‍යාපෘතිය

2.1.3 ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය

- කෘෂි නව්‍යකරණ වැඩපිළිවෙල ඉදිරියට ගෙන යාම සඳහා කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ආරක්ෂිත ගෘහයන් 14 ක් සහ බිම්මල් ගෘහ 19 ක් ඉදිකිරීම.
- වාණිජ දුරියන් වගාව ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අක්කර 9.75 ක දුරියන් වගාව පිහිටුවීම. (“තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ සීතාවක ප්‍රා. ලේ. කාර්යාලයේ ඇස්වත්ත ග්‍රාම නිලධාරී වසමේ අක්කර 1.75 ක දුරියන් වගාව ද සමස්ත ප්‍රගතියට ඇතුළත් කර ඇත.)
- කෘෂි නව්‍යකරණ වැඩපිළිවෙල ඉදිරියට ගෙනයාම සඳහා කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ අන්නාසි වගා ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා අක්කර 22.75 ක අන්නාසි වගාව පිහිටුවීම, වගා ආරක්ෂාව සඳහා සූර්ය පැනල විදුලි වැට වගා අක්කර 76 සඳහා ලබාදීම.
- පොහොර නිෂ්පාදනය, ආනයනය හා මිශ්‍ර කිරීම සම්බන්ධයෙන් නව බලපත්‍ර 15 ක් හා බලපත්‍ර අළුත් කිරීම් 24 ලබාදීම.
- පොහොර අලෙවියට සිල්ලර අලෙවි සැල් 31 ක් සඳහා ලියාපදිංචි බලපත්‍ර නිකුත් කිරීම.
- නියමිත කන්නය ආරම්භ වීමට ප්‍රථම පොහොර අවශ්‍යතාවය ගණනය කර ජාතික “පොහොර අවශ්‍යතාවය” සැකසීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත අදාළ දත්ත යොමු කිරීම.
- පොහොර සම්බන්ධ ගබඩා පරීක්ෂාවන් 123 ක් සිදුකිරීම.

2.1.4 ව්‍යවසාය සංවර්ධනය

- කාන්තාවන් 474 දෙනකු ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම.
- ස්වයං රැකියා නිෂ්පාදන අලෙවිපොළ 494 පැවැත්වීම මගින් හා කාන්තාවන්ගේ ස්වයං රැකියා නිෂ්පාදන සඳහා වෙළඳපොළ පහසුකම් සැපයීම.
- කණ්ඩායම් ව්‍යාපෘතීන් ලෙස පිරිසිදුකරණ සේවාවක් සහ සබන් නිෂ්පාදන ව්‍යාපාරයක් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරම්භ කිරීම.
- ස්වයං රැකියාවන්හි නිරත කාන්තාවන්ගේ නිෂ්පාදන අළෙවි කිරීමට කඩ කාමර 19 කින් සමන්විත ස්ථිර වෙළඳ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා මූලික පියවරයන් ක්‍රියාවට නැංවීම.
- “Super Fair” අලෙවි පොළ හා ප්‍රදර්ශන පැවැත්වීම තුළින් රු.10,607,687.00 අදායමක් ව්‍යවසායකයන් 461 දෙනෙකු වෙත ලබාදීම.
- කොළඹ දිස්ත්‍රික් ව්‍යවසාය සංගමයේ සාමාජිකයන් සඳහා මාකුබුර බහුවිධ අධිවේගී ප්‍රවාහන මධ්‍යස්ථානයේදී සෑම මසකට වරක් අලෙවි ප්‍රදර්ශන පැවැත්වීම සඳහා අවස්ථාවන් ලබාදීම.
- කැස්බැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණයෙන් ව්‍යවසායකයන්, ගැනුම්කරුවන්, විකුණුම්කරුවන් හමුව සඳහා සහභාගී වූ ව්‍යවසායකයන් 68 ක් අතරින් 52 දෙදෙනෙකු සඳහා අළෙවි අවස්ථා ලබාදීම.
- ග්‍රාම නිලධාරීන් 66 ක් සඳහා දින 10 ක සේවාරම්භක පුහුණු වැඩසටහන සාර්ථක අයුරින් නිම කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි රියදුරන් සඳහා පුහුණු වැඩමුළුවක් ඔරුගොඩවත්ත ජපන් කාර්මික විද්‍යාලයේ දී සාර්ථකව පැවැත්වීම.
- කර්මාන්තකරුවන් 100 දෙනෙකු සඳහා පරිගණක පුහුණුව හා අන්තර්ජාල වෙළඳාම පුහුණු කිරීම.
- ඉලේක්ට්‍රෝනික පුහුණුව සඳහා 08 දෙනෙක් හා පරිසණක දෘඩාංග පුහුණු ව 05 දෙනෙකු ආතර් සි ක්ලාක් මධ්‍යස්ථානයේ පුහුණු කර සහතික ලබාදීම.

2.1.5 මානව සම්පත් සංවර්ධනය

- විදේශ ගතවීමේ අරමුණ ශාක්ෂාත් කර ගැනීම සඳහා විගමනික පවුල් සඳහා සංවර්ධන සැලසුම් 27 ක්‍රියාත්මක කිරීම.
- විදෙස්ගත ශ්‍රමිකයන් නැවත සමාජගත කිරීමට හා නැවත සිදුවන විගමනය වළක්වා ගැනීම සඳහා රු.50,000 බැගින් 12 දෙනෙකුට ස්වයං රැකියා ප්‍රධානයන් ලබාදීම.
- විගමන පවුල්වල ප්‍රතිලාභීන් 647 වෙත අධ්‍යාපන ආධාර ලබාදීම.
- නාගරික වතු නිවාස ආශ්‍රිත පාසල් හැර ගිය තරුණ තරුණියන් 164 දෙනෙකු වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.
- ප්‍රතිලාභීන් 10286 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 258 ක් පැවැත්වීම.

- වෘත්තීය පුහුණු පාඨමාලා සහ ආධුනිකත්ව පුහුණුව සඳහා නවක පුහුණුලාභීන් 1319 ක් යොමු කිරීම.
- පෙර දැනුම ඇගයීම (RPL) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබාගැනීමට ශිල්පීන් 382 ක් යොමු කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් 4 ක් පැවැත්වීම හරහා 474 දෙනෙකු සඳහා වෘත්තීය මඟ පෙන්වීම.
- සෘජු රැකියා සඳහා යොමු කළ 191 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනක් පවත්වා රැකියා ගත කිරීම් 58 සිදුකිරීම.
- ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන් 9 ක් සම්බන්ධීකරණය කර පැවැත්වීම.
- RPL ක්‍රමය යටතේ නිපුණතා සහතික ලබාදීම සඳහා 54 දෙනෙකු යොමු කිරීම සහ ඔවුන් විදේශ රැකියා සඳහා ප්‍රවර්ධනය කිරීම.
- සේවාලාභීන්ගේ ගැටලු සහගත තත්වයන් තක්සේරු කිරීම උදෙසා මනෝ විද්‍යාත්මක තක්සේරු මාපකයක් භාවිත කිරීම.

2.1.6 පාරිභෝගික ආරක්ෂණය

- ආර්ථික අර්බුදය හේතුවෙන් සීමිත පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයක් ආනායනය කළ ද,
  පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර 225 ක් හා බලපත්‍ර 50 ක් අතරේ ආනයනය කරන ලද පුපරණ ද්‍රව්‍ය සමානුපාතිකව බෙදාදීම මඟින් කර්මාන්ත හා සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- සේවාලාභීන්ගේ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාවත්කාලීන කිරීම මඟින් පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර 225 ක් හා බලපත්‍ර 50 ක් කඩිනමින් ලබාදීමට හැකියාව ලැබීම.
- දිස්ත්‍රික්කයේ පුපුරන ද්‍රව්‍ය ගබඩා නවීකරණය කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කිරුම් හා මිනුම් උපකරණ සත්‍යෝක්ෂණය පිළිබඳව වෙළෙඳුන් දැනුවත් කිරීම 2023 වර්ෂයට වඩා 32%කින් වැඩි කර ගැනීම.
- තැත්කළ වැටලීම් හා නඩු පැවරීම් ප්‍රමාණය 2023 වර්ෂයට වඩා 200% කින් ඉහළ නැංවීම නිසා වෙළෙඳුන්ගෙන් පාරිභෝගිකයාට සිදුවන අපහසුතාවයන් විශාල ලෙස අවම කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කිරුම් හා මිනුම් උපකරණ සත්‍යෝක්ෂණය පිළිබඳව වෙළෙඳුන් දැනුවත් කිරීම හා වැටලීම් සිදු කිරීම මඟින් සත්‍යෝක්ෂණ ආදායම 25% කින් වැඩි කර ගැනීම.

2.1.7 සමාජ ආරක්ෂණය

- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා පුද්ගලයින් 816 දෙනෙකු සාමාජික කරලීම.
- අඛන්ඩව 2024 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් 60 ක් ප්‍රධානය කිරීම.

- අසරණ පවුල් 545 ක් සඳහා මාස දෙකක් රුපිල් 6500/- ක් වටිනාකමකින් යුත් වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීම.
- ස්වශක්ති අභිමානී 2024 කරගාවලියේ සේවක සංඛ්‍යාව 50 ට අඩු ආයතනවල සේවා යෝජකයින් ඇගයීමේ තරගාවලියේ දී හෝමාගම සහනෝදය පදනම ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම.
- සුදුසකම් සම්පූර්ණ කරන ලද අවු. 18 ත් 35ත් අතර තරුණ තරුණියක් 16 දෙනෙකුට පුද්ගලික අංශයේ ස්ථීර රැකියා ලබාදීම.
- ප්‍රජා සමථ මූල මණ්ඩල 3 ක් සඳහා සාමාජිකයින් 90 ක් බඳවා ගැනීම.
- පාසල් සමථකරණ වැඩසටහන් 20 ක් පවත්වා සිසුන් 500 ක් පමණ සමථකරණය පිළිබඳව දැනුවත් කිරීම.

2.1.8 ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය

- ගෘහස්ථ හිංසනයට ලක් වූ කාන්තාවන් 58 දෙනෙකු හා ළමුන් 39 දෙනෙකුට තාවකාලික රැකවරණය ලබාදීම.
- ගැබිණි හා කිරිදෙන මව්වරුන් සඳහා රු. 45,000.00 ක් වටිනා පෝෂණ මල්ලක් ලබා දීම හා පෝෂණ ඌණතා සහිත ගර්භනී මව්වරුන්ට වියළි ආහාර පාර්සල් ලබා දීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පෙර පාසැල් දරුවන්ට උදෑසන ආහාර වේලක් ලබාදීම.
- පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසිකව රු. 5,000.00 ක් ලබා දීමේ වැඩසටහන සිදු කිරීම හා ප්‍රතිපාදන රහිත ගුරුවරියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පෙරපාසල් සඳහා ජල පෙරණ කට්ටල ලබාදීම.
- ප්‍රතිපාදන රහිතව පෙර පාසල් දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීම.
- ආන්තික ප්‍රජාවගේ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා උපත් සහතික ලබාදීමේ වැඩසටහන යටතේ හඳුනාගත් දරුවන් 80 දෙනෙකුගෙන් 55 දෙනෙකු සඳහා උපත් සහතික සකස් කිරීම.
- ළමා ආරක්ෂණ සැලසුම් 57 ක් ක්‍රියාත්මක කිරීම.
- ආර්ථික අපහසුතා සහිත අකණ්ඩව පාසල් නොයන දරුවන් 1185 දෙනෙකු සඳහා අවශ්‍ය අධ්‍යාපනික උපකරණ ලබාදීම හා රු.2,066,000.00 අධ්‍යාපනික ආධාර ලබාදීම.
- ළමා ආරක්ෂාව සුරක්ෂිත කිරීම, ආපදා කළමණාකරණය හා අඩු වයස් ගැබ්ගැනීම් අවම කිරීම පිළිබඳව සාර්ව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 1200ක් පැවැත්වීම හා ඒ හරහා පුද්ගලයන් 27, 288 ක් දැනුවත් කිරීම.

2.1.9 සමාජ සංවර්ධනය

- ආපදාවන්ට ලක් වූ පවුල් 39,938 කට අයත් පුද්ගලයින් 145,471 දෙනකුට කඩිනම් ආපදා සහන සැලසීම.
- ආපදාවන්ට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ නිවාස හා ව්‍යාපාරික ස්ථාන 1,712 ක් නිසි පරිදි යථාවත් කර අවසන් කිරීම.
- අවු. 60 ට වැඩි වැඩිහිටියන්ගේ අවම පහසුකම් නංවාලීමට කොමඩ් සහිත වැසිකිලි, ඇඳ, මෙට්ට, ඇඳ ඇතිරිලි, විදුලි පංකා ආදිය ලබාදීම, කාමරයේ පිහන් ගඩොල් ඇතිරීම වැනි සුඛසාධන කටයුතු සඳහා 200 දෙනෙකුට රු.10,000,000.00 ක ආධාර ලබාදීම.
- ස්වයං රැකියා ආධාර යටතේ වැඩිහිටියන් 15 කු සඳහා රු 750,000.00 ක ආධාර ලබාදීම.
- ස්ථිර නිවාස අහිමි වැඩිහිටි පවුල් 3 ක් සඳහා ස්ථිර නිවාස 03 ක් ඉදි කිරිමට රු 2,100,000.00 ක ආධාර ලබාදීම.
- වැඩිහිටි කමිටු සාමාජිකයින්ට වන්දනා චාරිකා සඳහා කමිටු 26 කට රු.1,950,000.00 ක මුල්‍යාධාර ලබාදීම.
- සමෘද්ධි දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත අඩු ආදායම්ලාභී නිවාස 45ක වැඩ අවසන් කිරීම.
- ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනයට සමගාමීව 2024 වර්ෂයේ මුළු කොඩි විකුණුම් ආදායම වශයෙන් රු.13,005,742.00 ක මුදලක් ඉපැයීම.
- අලෙවි වැඩසටහන යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවුල් හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා, Mini Food City - වැඩසටහන් 01, RPL ක්‍රමවේදය යටතේ NVQ සහතික ලබාදීමේ වැඩසටහන් 13, වෘත්තිය මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන් 13, ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 06, ආධුනික වෘත්තිය පුහුණු අවස්ථා සඳහා සම්බන්ධ කිරීමේ වැඩසටහන් 06 ක් පැවැත්වීම.

2.1.10 පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය

- හෝමාගම, සීතාවක හා කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ඌණ පරිහරණ ඉඩම් කට්ටි 30 ක් කෘෂිකාර්මික ඉඩම්වල පස හා ජලය සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම.
- "කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් රටට අහිමිවන වන සම්පත" මැයෙන් හඳුනාගත් විශේෂ ඉඩම් පරිහරණ ගැටළු විසඳා ගැනීම සඳහා ගවේශනාත්මක තොරතුරු ඇතුළත් වාර්තාවක් සැකසීම.
- ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය යටතේ කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන 1:50,000 සිතියම් 36ක් යාවත්කාලීන කර අවසන් කිරීම.
- "Zero Plastic" ආදර්ශ දිස්ත්‍රිකයක් ලෙස නම් කිරීමට අදාළව පළාත් පාලන ආයතන, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් යෝජිත ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකා

පාර්ලිමේන්තුවේ ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට භාරදීමට කටයුතු කිරීම.

- දිස්ත්‍රික්කය තුළ ඇති කර්මාන්ත පිළිබඳව කර්මාන්ත සමීක්ෂනයක් සිදු කිරීම.

2.1.11 ආගමික හා සංස්කෘතික කටයුතු

- ජාතික සාහිත්‍ය මහොත්සවයේ වැඩිම ජයග්‍රාහන ප්‍රමාණයක් හිමි කර ගැනීම.
- දිස්ත්‍රික්කයේ සියලු කලායතන එක් කර ගනිමින් කලායතන ප්‍රසංගයක් පැවැත්වීම.
- ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සාර්ථක දිස්ත්‍රික් කාන්තා දින සැමරුම් උත්සවයක් සංවිධානය කර පැවැත්වීම.
- භාෂා සතියට සමගාමීව සිංහල, මුස්ලිම්, දෙමළ පාසැල් 10 ක ශිෂ්‍ය නායක නායිකාවන් 250 ක් දැනුවත් කිරීම.
- රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය සඳහා සිංහල, ඉංග්‍රීසි, දෙමළ ඒකාංගික ටෙලිනාට්‍ය තරඟාවලියක් හා කෙටි චිත්‍රපට තරඟාවලියක් පැවැත්වීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාෂා සැලසුම් පහසුකරන තෙදින වැඩසටහනක් පැවැත්වීම.
- සීතාවක ප්‍රාදේශීය සභාවේ පිළිජ් ගුණවර්ධන පුස්තකාලය වෙත රු 100,000.00 ක ප්‍රතිපාදන මත ත්‍රෙභාෂා පොත් ලබාදීම.
- දෙමළ/ සිංහල භාෂා ගුරුවරු 60 ක් පුහුණු කිරීම.
- භාෂා පාඨමාලා 13 ක් සාර්ථකව නිම කිරීම.

2.2 අභියෝග

2.2.1 ආයතනික, පරිපාලන හා මූල්‍යකරණය

- නිලධාරීන් දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීම හේතුවෙන් ප්‍රමාණවත් නිලධාරීන් නොමැතිව ගැටළුකාරී තත්ත්වයන් අවම වන පරිදි රාජකාරී කටයුතු කිරීම.
- මැතිවරණ 2 ක රාජකාරී හේතුවෙන් කාර්යාල කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම.
- සීමිත කාලරාමුවකට යටත්ව සිදුකළ යුතු හදිසි රාජකාරී කටයුතු ද දෛනික රාජකාරී කටයුතු සමඟ කළමණාකරනය කර ගනිමින් කටයුතු කිරීමට සිදුවීම.
- ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණයේ කම්ටු රාජකාරී ඉටුකරන අතරතුර අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම, දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් 04 සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් 52 ක් පැවැත්වීම.
- වැය ශීර්ෂ 51 ක් හා ආදායම් ශීර්ෂ 15 ක් අතරින් 75% ක පමණ ප්‍රමාණයක් විගණනය කිරීමට සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු ප්‍රමාණවත් නොවීම.

- කාර්යාලීයේ නිලධාරීන්ගේ අන්තර්ජාල භාවිතය, පරිගණක ක්‍රියාකරවීම නවීන තාක්ෂණික යෙදවුම් පිළිබඳ දැනුම අසතුටුදායක මට්ටමක පැවතීම හා දැනුම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික උපකරණ හිඟවීම.
- ගිණුම් අංශයේ ස්ථාන මාරුවීම්, විදේශ ගතවීම් හා උසස්වීම් ලබා ඉවත්ව ගිය නිලධාරීන් **06** ක් පුරප්පාඩුව පවතින අතරතුර දෛනික රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කිරීම.

2.2.2 ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන

- නිලධාරීන්ගේ සාමාන්‍ය දෛනික රාජකාරිවලට අමතරව, ජන හා නිවාස සංගණනය 2024 හි ගණන් ගැනීමේ කටයුතු ද, කෘෂිකාර්මික ගණන් ගැනීම්, ආර්ථික සංගණනය හා ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය සිදු කිරීම.
- නිරන්තර ස්වභාවික ආපදා තත්වයන්ට මුහුණ දීමට සිදුවීමෙන් සැලසුම්වලට පරිබාහිර ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සිදුවීම.

2.2.3 ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය

- ව්‍යාපෘති ක්‍රියාත්මක වනුයේ 50% ප්‍රතිලාභී දායකත්වය මත බැවින් ආර්ථික අපහසුතා මත ප්‍රතිලාභීන්ගේ අභිමතය වෙනස්වීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින විට ප්‍රතිලාභීන් විවිධ වූ අපහසුතා මත ව්‍යාපෘතිවලින් ඉවත්වීම නිසා ව්‍යාපෘති අතරමඟ නවතා දැමීමට සිදුවීම.
- මූල්‍ය ප්‍රතිපාදන තෙවන කාර්තුවේ දී ලබාදුන් නමුත්, ව්‍යාපෘති කටයුතු සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු බැවින් ප්‍රතිලාභීන් වැඩි ප්‍රමාණයකට ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම සඳහා නිරන්තරයෙන් දිරිමත් කිරීමට සිදුවීම.
- පොහොරවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා නිරන්තර ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකළ යුතු බැවින් දිස්ත්‍රික්කයේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වාහනයක් අනුයුක්ත කර ගැනීම. (දැනට පෞද්ගලික වාහනය පරිහරණය කිරීමෙන් ක්ෂේත්‍ර කටයුතු සිදු කරයි)

2.2.4 ව්‍යවසාය සංවර්ධනය

- ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් වැඩිවීම හා අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා අඩු ආදායම්ලාභීන්ගේ කුඩා පරිමාණ ව්‍යාපෘති පවත්වාගෙන යාම අසීරු වීම.
- අමුද්‍රව්‍ය මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් ව්‍යවසායකයන්ට පවතින නිෂ්පාදන ගැටළු සඳහා සහය ලබාදීමට සිදුවීම.
- අධික ජීවන වියදම හමුවේ වෙළෙඳ පොළ අවස්ථා සීමිත වීම මත, නව වෙළෙඳ පොළ අවස්ථා සොයා දීමට කටයුතු කිරීම.

- භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාම මත, පාරිභෝගිකයන් අතවශ්‍ය භාණ්ඩ පමණක් පාරිභෝජනය කිරීම හේතුවෙන් විසිතුරු භාණ්ඩ, අත්කම් නිෂ්පාදන වැනි අනෙකුත් භාණ්ඩ සඳහා ඉල්ලුම අවම වීම.
- බැංකු මගින් නව ව්‍යාපාර උත්පාදනය හා පවතින ව්‍යාපාර සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබාදීම අවම කිරීම හේතුවෙන් ව්‍යාපාරිකයන්ට මුල්‍ය ගැටළු මතුවීම.
- නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සුළු පරිමාණ චක්‍රීය ණය (රු.10,000 සිට 30,000) දක්වා, කාන්තා බලමණ්ඩල හරහා ලබා දුන්න ද ඉන් ඔබ්බට මුල්‍ය ආයතන මඟින් ණය ලබා ගැනීමේ දී දැඩි ණය කොන්දේසි පනවා තිබීම. (උදා: රජයේ සේවක ඇප කොන්දේසි)
- කාන්තාවන්ගේ ස්වයං රැකියා නිෂ්පාදන ව්‍යාපාර ලියාපදිංචිය සඳහා යොමු කළ ද ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමට නොහැකිවීම. (කුලී නිවාස/ ගෘහස්ථ හිංසනයට පත් කාන්තාවන්/ ඔප්පු නිරවුල් නොවූ වැන්දඹු කාන්තාවන්)

2.2.5 මානව සම්පත් සංවර්ධනය

- විදේශගත ශ්‍රමියන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම.
- සමාජීය වශයෙන් ජනතාවගේ පවතින යැපුම් මානසිකත්වය හේතුවෙන් විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීමට අපහසු වීම.
- වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ගාස්තු අය කිරීම හේතුවෙන් පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම අසීරු වීම.
- වර්තමානයේ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ඇති වී තිබෙන අධික ඉල්ලුමට සරිලන පරිදි ආයතනවල ධාරිතාවය ප්‍රසාරණය නොවීම හා ඇතැම් පාඨමාලා යාවත්කාලීන නොවීම.
- දෙමළ මාධ්‍යයෙන් පවත්වන පාඨමාලා සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.
- රැකියා අපේක්ෂිතයන් වැඩි පිරිසක් රජයේ රැකියාවක් සෙවීම මත ඔවුන්ව ක්ෂේත්‍රගත රැකියා සඳහා යොමු කරවීම.
- වැඩි ඉල්ලුමක් පවතින කුසලතා සහිත රැකියා සඳහා, කුසලතා සහිත අපේක්ෂිතයන් සොයා ගැනීම. (උදා, විදුලි කාර්මික, ජල නල කාර්මික)
- මැතිවරණ පැවැත්වීම හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභ කටයුතු නතර කිරීමට සිදුවීම.
- රැකියා අපේක්ෂිතයින් බලාපොරොත්තු වන ආදායමට සරිලන රැකියාවක් සොයාදීම.
- වයස අවු.40 ට වැඩි පුද්ගලයින්ගේ රැකියා ඉල්ලුම වැඩිවන නමුත්, එම වයස්වල පුද්ගලයින් රැකියා සඳහා බඳවා ගැනීමට ආයතන මැළිකමක් දැක්වීම.

2.2.6 පාරිභෝගික ආරක්ෂණය

- කළුගල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල ඉල්ලුම පහළ යාම මත එම කර්මාන්තකරුවන් කර්මාන්තය තුළ රඳවා ගැනීම.

- පුපුරන ද්‍රව්‍ය විධිමත් හා නියමිත තාක්ෂණික ක්‍රමවේදයන් යටතේ ගබඩා කිරීම සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට සුදුසු රජයේ ඉඩමක් වෙන් කරවා ගැනීම.

2.2.7 ළමා හා කාන්තා සුරක්ෂිතතාව හා සංවර්ධනය

- ගෘහස්ථ හිංසනයට පත්වන කාන්තාවන් පිළිබඳ සියලු සත්‍ය සිදුවීම් නිලධාරීන් වෙත වාර්තා නොවීම.
- කුඩා පරිමාණයේ ස්වයං රැකියා ආරම්භ කර පවත්වා ගෙන යන කාන්තාවන් සඳහා ණය යෝජනා ක්‍රමවලින් ණය ලබා ගැනීමට නොහැකිවීම.
- හිංසනයට පත් කාන්තාවන් තාවකාලික රඳවා තබා ගැනීමට කාන්තා රැකවරණ මධ්‍යස්ථානයක් නොමැති වීම.
- විවිධ පෞද්ගලික ආයතන විසින් අනාරක්ෂිත ලෙස ක්ෂුද්‍ර ණය ලබාදෙන සමිති ගම් මට්ටමින් පිහිටුවීම හේතුවෙන් බහුතරයක් කාන්තාවන් එම සමිති හරහා ක්ෂණික ණය ලබා ගැනීමට පෙළඹීම.
- සියලුම ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල ලබාදීම ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වීමේදී ආර්ථිකය ශක්තිමත් පුද්ගලයන් එය නිසි අයුරින් භාවිතා නොකිරීම.
- පෙර පාසැල් දරුවන්ට උදෑසන ආහාර වේලක් ලබාදීම වැඩසටහන වෙනුවෙන් එක් දිනක් සඳහා එක් දරුවෙක් වෙනුවෙන් ලබාදෙන රු 60.00 ක මුදල ප්‍රමාණවත් නොවීම.
- ළමා මිතුරු සෙල්ලම් පාදක අධ්‍යාපනය පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් පුහුණුවුවත් එය ප්‍රායෝගිකව භාවිතා නොකරන අතර, ඊට නිතීමය වශයෙන් ක්‍රියා කිරීමට බලයක් නොමැති වීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දරුවන්ගේ පියවරුන් සහභාගීත්වය ලබාගැනීම.
- සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටුවා ඇති ළමා සමාජ සක්‍රියව පවත්වා ගෙන යාම.
- ක්ෂේත්‍රගත රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හා මාසික ගමන් වියදම් දීමනාව ප්‍රමාණවත් නොවීම.

2.2.8 සමාජ සංවර්ධනය

- සමාජ සේවා සුබ සාධන හා සංවර්ධන වැඩසටහන්වලදී නිවාරනාත්මක හා සංවර්ධනාත්මක ප්‍රවේශයන්, නව දැනුම, සංවර්ධන ආකෘති හා මොඩලයන්, කාර්ය සාධන පර්යේෂණ යොදා නොගැනීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගේ ආබාධිතබව අවම කර ගැනීමට ලබාදෙන ආධාර උපකරණ සංචිත ඉහළ නංවා ගැනීම.
- උපදේශන සේවාව පිළිබඳව අපේක්ෂිතයන් තුළ පවතින ආකල්ප නිවැරදි කිරීමට සිදුවීම.
- සමථකරණ ක්‍රියාවලිය පිළිබඳව අධිකරණ ක්‍රමවේදය තරම් ජනතාව දැනුවත් නොවීම.
- සමථ මූල මණ්ඩල මාසික රැස්වීම් වාර 2 කට සීමා වීම.

- මනෝ උපදේශන කටයුතු වල දී සේවාලාභීන්ගේ පෞද්ගලිකත්වය රැකෙන පරිදි කටයුතු ඉටු කිරීමට නොහැකි වීම.
- රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් විෂය පථයට අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනගා ගැනීමේ අපහසුතාවය.

2.2.9 පරිසර සංරක්ෂණය හා ඵලදායී ඉඩම් පරිහරණය

- ප්‍රාදේශීය ලේකම් සතුව රජයේ ඉඩම් පිළිබඳ ඇතැම් තොරතුරු නොමැතිවීම තුළ කටයුතු කිරීමට සිදුවීම.
- හඳුනාගෙන නොමැති රජයේ ඉඩම් හා අනවසර අල්ලා ගැනීම් තත්ත්වයන් මත ක්‍රියා කිරීමට සිදුවීම.
- නීත්‍යානුකූලව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම.
- රාජකාරී සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික පහසුකම් නොලැබීම.

2.2.10 ආගමික හා සංස්කෘතික

- භාෂා පාඨමාලා පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
	vi. අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන යටතේ ලැගුම්හල් හිමියන් දැනුවත් කිරීම (50)	දැනුවත් කරන ලද ලැගුම්හල් හිමියන් ගණන පසුගිය වසරේ අඩු වූ වාර්තාගත අඩුවයස් ගැබ් ගැනීම් සංඛ්‍යාව			
	vii. දැරියන්ගේ ජීවන නිපුණතා ඉහළ නැංවීම සඳහා උසස් තත්ත්වයේ පොත්පත් කියවීමට පුස්තකාල සේවාවන් සැලසීම (ඉලක්කගත දැරියන් සංඛ්‍යාව 400)				
	viii. දරුවන් සමඟ වීදියේ ව්‍යාපාර කරන පවුල් කළමනාකරණය යටතේ ඉලක්කගත පවුල් සංඛ්‍යාව (11)	කළමනාකරණය කරන ලද පවුල් සංඛ්‍යාව (9)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරී					
(SDG 01) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.	i. කාන්තාවන් 35 දෙනකු ස්වයං රැකියාගත කිරීම තුළින් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම	ස්වයං රැකියා ගන්වන ලද කාන්තාවන් (245)			✓
	ii. කාන්තාවන් 150 දෙනකු ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම උදෙසා දැනුමින් සන්නද්ධ කිරීම	• පැවැත් වූ පුහුණු වැඩසටහන් (27) • පුහුණුව ලබා ගත් කාන්තාවන් (245)			✓
	iii. කාන්තාවන් 30 දෙනෙකුගේ ස්වයං රැකියා ආරම්භය හා වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම (වක්‍රීය ණය)	• නිකුත් කරන ලද ණය මුදල් ප්‍රමාණය (රු.290,000.00) • ණයලාභීන් සංඛ්‍යාව (27)			✓
(SDG 01) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.	iv. අන්තර්ජාල අලෙවිකරණ වේදිකාව සඳහා ව්‍යවසායක කාන්තාවන් ලියාපදිංචි කිරීම (5)	අන්තර්ජාල අලෙවිකරණ වේදිකාව සඳහා යොමු කළ ව්‍යවසායිකාවන් සංඛ්‍යාව (62)			✓
	v. ස්වයං රැකියා නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා ඇති කිරීම - අලෙවි පොළ (70)	පවත්වන ලද අලෙවි පොළ (494)			✓
	vi. ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම (01)	• අලෙවි මධ්‍යස්ථාන • (01) • ලබා දුන් අලෙවි කුටි සංඛ්‍යාව (09) • නව ව්‍යවසායිකාවන් සංඛ්‍යාව (32)			✓
(SDG 05) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	vii. කාන්තා හිංසනය සම්බන්ධව පැමිණෙන කාන්තාවන් 210 දෙනකු සහාය සේවා වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණය.	සහාය සේවාවන් සඳහා යොමු කරන ලද කාන්තාවන් සංඛ්‍යාව (457)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
(SDG 05) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	viii. හිංසනයට පත් කාන්තාවන් 25 දෙනෙකුගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා තාවකාලිකව නිවාසගත කිරීම. (50)	කාන්තා පිහිට ආයතනය මඟින් රැකවරණය ලබා දුන් සංඛ්‍යාව (කාන්තාවන් 58 හා ළමුන් 39)			✓
	ix. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ හිංසනයන් වැළැක්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් කාන්තා සංවර්ධන කමිටු හඳුන්වා දීම හා ත්‍රෛමාසික රැස්වීම් පැවැත්වීම.	• පවත්වන ලද කමිටු රැස්වීම් සංඛ්‍යාව (06)		✓	
(SDG 05) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	x. කාන්තාවන් සංවිධානගත වීම හා දැනුමින් හා කුසලතාවන්ගෙන් සපිරි සමාජ ක්‍රියාකාරීනියන් බිහිවීම (පවත්වන ලද කාන්තා සංවිධාන රැස්වීම් සංඛ්‍යාව 250)	ලියාපදිංචි කර ඇති කාන්තා කාර්ය සංවිධාන සංඛ්‍යාව (23)		✓	
		ප්‍රාදේශීය බලමණ්ඩල පවත්වා ඇති සමිති වාර සංඛ්‍යාව (82)			✓
		කාන්තා කාර්ය සංවිධාන මාසික රැස්වීම් (459)			✓
* කාන්තාවන් ස්වයං රැකියාගත කිරීමේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ප්‍රතිපාදනවලට අමතරව රාජ්‍ය නොවන සංවිධාන ප්‍රතිපාදන ද යොදා ගන්නා ලදී.					
දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී					
(SDG 03) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	i. ළමා මාර්ගෝපදේශණ මධ්‍යස්ථාන, කුසළතා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂාව, ලියාපදිංචිය හා මූල්‍යාධාර ලබාදීම.	ළමා මාර්ගෝපදේශණ මධ්‍යස්ථාන 1 ක් සහ කුසළතා සංවර්ධන මධ්‍යස්ථාන 06 ක් පරීක්ෂාව, ලියාපදිංචිය හා මූල්‍යාධාර ලබාදීම.		✓	
	ii. අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා මාසිකව රු. 7500 බැගින් ජීවනාධාර / වකුගඩු ආධාර රු. 7500 ලබාදීම.	• ජීවනාධාර ලබාදුන් ප්‍රතිලාභීන් (6555) • වකුගඩු ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් (1339)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
(SDG 03) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	iii. ආබාධ සහිත පුද්ගලයන් සඳහා නිවාස ආධාර ලබා දීම (10)	නිවාස ආධාර ලබා දුන් ප්‍රතිලාභීන් (07)		✓	
	iv. ආබාධ සහිත පුද්ගලයන් 15 ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම	ස්වයං රැකියා ආධාර ලබාදුන් ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව (09)		✓	
	v. ආබාධ සහිත පුද්ගලයන් 100 ක් සඳහා උපකරණ අවශ්‍යතා සැපයීම	උපකරණ අවශ්‍යතා ලබා දුන් ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව (12)	✓		
	vi. තෝරාගත් ආබාධ සහිත පුද්ගලයන්ගේ නිවාස සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දීම (10)	ප්‍රවේශ පහසුකම් ලබා දුන් ප්‍රතිලාභීන් (06)		✓	
	vii. තෝරාගත් ආබාධ සහිත පුද්ගලයන් 10 ට නිවාස සඳහා ප්‍රවේශ පහසුකම් ලබාදීම	නිවාස සඳහා ප්‍රවේශ පහසුකම් ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව (06)		✓	
(SDG 02) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	viii. ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකරණ සැපයීම (100)	උපකරණ ලබා දුන් ප්‍රතිලාභීන් (12)	✓		
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	ix. ආබාධ සහිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම (15)	ස්වයං රැකියා ආධාර ලබා දුන් ප්‍රතිලාභීන් (09)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි					
(SDG 01) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.	i. රු. 3000 වැඩිහිටි ජීවනාධාර දීමනා වැඩිහිටියන් 28515 ක් සඳහා ලබාදීම.	ප්‍රතිලාභීන් (28515)			✓
	ii. රු. 5000 සියවස්පූර්ණ දීමනාව අඩු ආදායම්ලාභී වැඩිහිටියන් 32 දෙනකු සඳහා ලබාදීම.	ප්‍රතිලාභීන් (32)			✓
(SDG 03) නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	iii. ආරෝග්‍යා ආධාර ලබාදීම.	ප්‍රතිලාභීන් (48)		✓	
(SDG 03) නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	iv. අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා දිරිය පියස නිවාස ආධාර ලබා දීම.	ප්‍රතිලාභීන් (03)			✓
	v. අවම පහසුකම් නංවාලීමට වැඩිහිටියන් සඳහා ආධාර ලබාදීම.	ප්‍රතිලාභීන් (200) මුදල රු.10,000,000.00			✓
	vi. වැඩිහිටියන් සඳහා ඇස් කණ්ණාඩි ලබා දීම	ප්‍රතිලාභීන් (91)			✓
	vii. වන්දනා චාරිකා සඳහා ආධාර ලබාදීම	වන්දනා චාරිකා (26) මුදල රු.1,950,000.00			✓
	viii. වැඩිහිටි සංවිධාන සඳහා ආධාර ලබාදීම	වැඩිහිටි සංවිධාන (30) මුදල රු.3,000,000.00		✓	
	ix. වැඩිහිටියන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම	වෛද්‍ය සායන (18)		✓	
(SDG 08) සියල්ලන් සඳහාම පූර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	x. වැඩිහිටියන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.	ප්‍රතිලාභීන් (15) මුදල රු.750,000.00		✓	
	xi. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දීම.	දිවා මධ්‍යස්ථාන (03)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
(SDG 01) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	xii. වැඩිහිටියන් 98 දෙනකු සඳහා ශ්‍රවන උපකරණ ලබා දීම සහ 112 දෙනකු සඳහා ඇස් කණ්ණාඩි ලබාදීම.	ප්‍රතිලාභීන් (210)			✓
(SDG 02) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	xiii. වන්දනා චාරිකා 28 ක් සඳහා රු.75,000.00 බැගින් ආධාර ලබාදීම.	ආධාර ලබාදුන් වැඩිහිටි සංවිධාන (28)		✓	
	viii. වැඩිහිටි සංවිධාන බල ගැන්වීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට සංවිධාන 23 ක් වෙනුවෙන් රු.100,000.00 බැගින් ආධාර ලබා දීම.			✓	
	ix. වැඩිහිටියන් සඳහා දිවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම.	ඉදි කළ දිවා මධ්‍යස්ථානය / වැය වූ මුදල රු. ලක්ෂ 35		✓	
	x. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා උපකරණ මිල දී ගැනීම සඳහා ආධාර ලබාදීම.	ආධාර ලබාදුන් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන (01) / වැය වූ රු. 500,000.00		✓	
	xi. වැඩිහිටියන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම.	පැවැත් වූ වෛද්‍ය සායන (11)			✓
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	xi. වැඩිහිටියන් 12 දෙනකු සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.	ප්‍රතිලාභීන් (12) / මුදල රු 600,000.00 වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 02 ක ස්වයං රැකියා ආරම්භ කිරීම.		✓	
	xii. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 02 ක් සඳහා ස්වයං රැකියා අවස්ථා හඳුන්වාදීම.	ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දුන් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන (02)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
විදාතා නිලධාරී					
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. (SDG 01) දිළිඳු බව පිටු දැකීම.	i. නව කර්මාන්ත කරුවන් බිහි කිරීම (25).	බිහි කළ නව කර්මාන්තකරුවන් සංඛ්‍යාව (25)		✓	
	ii. ව්‍යවසායකයින් සඳහා පරිගණක තාක්ෂණය පුහුණුව ලබාදීම හා අන්තර්ජාල අලෙවි ප්‍රවේශයක් ආරම්භ කිරීම.	පරිගණක තාක්ෂණ පුහුණුව ලද ව්‍යවසායකයින් (907) / හා අන්තර්ජාල අලෙවි ප්‍රවේශයක් ආරම්භ කළ ව්‍යවසායකයින් (32)	✓		
	iii. ව්‍යවසායකයින් සඳහා පාවහන් හා ඇඟළුම් ආශ්‍රිත විද්‍යාත්මක හා තාක්ෂණික පුහුණුව ලබා දීම.	පුහුණුව ලැබූ සංඛ්‍යාව (18)			✓
	iv. ඉලෙක්ට්‍රොනික පුහුණුව (07) හා පරිගණක දෘඩාංග පුහුණුව (06) සඳහා ව්‍යවසායකයින් යොමු කිරීම.	ඉලේක්ට්‍රොනික පුහුණුව ලද ව්‍යවසායකයින් (07) / පරිගණක දෘඩාංග පුහුණු ලද ව්‍යවසායකයින් (06)			✓
(SDG 09) සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.	v. තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන් 420ක් පැවැත්වීම.	පවත්වන ලද තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (420)			✓
	vi. නිෂ්පාදන සඳහා තත්ව හා ප්‍රමිති සහතික ලබා දීම (26).	නිෂ්පාදන සඳහා ලබා දුන් තත්ව හා ප්‍රමිති සහතික සංඛ්‍යාව (26)			✓
(SDG 09) සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.	vii. නිෂ්පාදන සඳහා අයි.ටී.අයි. උසස් තාක්ෂණ සහාය ලබාදීම (06).	නිෂ්පාදන සඳහා ලබාදුන් අයි.ටී.අයි. උසස් තාක්ෂණ සහාය (06)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
	viii. අලෙවි පොළ හා ප්‍රදර්ශනය මගින් ව්‍යවසායකයින් සඳහා අලෙවි පහසුකම් ලබාදීම. (55)	පහසුකම් ලබා දුන් ව්‍යවසායකයින් (55)			✓
මානව සම්පත් සංවර්ධන නිලධාරී/ රැකියා කේන්ද්‍රය					
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ හා තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	i. තරුණ තරුණියන්ට රැකියා අවස්ථා 150 ක් ලබාදීම	රැකියාගත වූ තරුණ තරුණියන් සංඛ්‍යාව (191)			✓
	ii. නව ව්‍යවසායකයින් 40 ක් බිහි කිරීම	සුළු පරිමාණ ව්‍යවසායකයින් සංඛ්‍යාව (11)	✓		
	iii. රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් 200 දෙනකුට වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම.	වෘත්තීය මාර්ගොපදේශය ලබාගත් රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් (474)			✓
	iv. සිසුන් 80 දෙනකු වෘත්තීය පුහුණුවට යොමු කිරීම.	වෘත්තීය පුහුණුව යොමු කළ සංඛ්‍යාව (14)	✓		
නිපුණතා සංවර්ධන නිලධාරී					
(SDG 08) ධරණීය සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායි රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය.	i. නාගරික වතු නිවාස ආශ්‍රිත පාසල් හැර ගිය තරුණ තරුණියන් 200 දොනකු වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.	වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමුකළ තරුණ තරුණියන් සංඛ්‍යාව (164)			✓
(SDG 08) ධරණීය සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායි රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය.	ii. වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත් කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සිදු කිරීම (වැඩසටහන් 250)	පැවැත් වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සංඛ්‍යාව (258)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
(SDG 08) ධරණීය සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායී රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය.	iii. පාසල් සිසුන්, පාසල් හැර ගිය සිසුන්, දෙමව්පියන් හා ගුරුවරුන් ආදී අදාල ඉලක්ක කණ්ඩායම් දැනුවත් කිරීම (ප්‍රතිලාභීන් 8000).	වැඩසටහන් සඳහා සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව (10286)			✓
	iv. පාසල් වෘත්තීය මාර්ගෝපදේශන ඒකක 25ක් පිහිටුවීම.	පිහිටුවන ලද පාසල් වෘත්තීය මාර්ගෝපදේශන ඒකක සංඛ්‍යාව (03)	✓		
	v. වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ආධුනිකයන් යොමු කිරීම (අපේක්ෂිත සංඛ්‍යාව 1000)	යොමු කළ ආධුනිකයන් සංඛ්‍යාව (1319)			✓
	vi. පෙර දැනුම ඇගයීම (RPL) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබා ගැනීමට යොමු කිරීම (අපේක්ෂිත සංඛ්‍යාව 150)	(NVQ) සහතික ලබා ගැනීමට යොමු කළ සංඛ්‍යාව (382)			✓
(SDG 08) ධරණීය සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායී රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය.	vii. NVQ සහතිකලාභී ශිල්පීන් නිපුණතා බලපත්‍රය (Skill Passport) ලබා ගැනීම සඳහා යොමු කිරීම. (අපේක්ෂිත 200)	නිපුණතා බලපත්‍රය (Skill Passport) ලබා ගැනීම සඳහා යොමු කළ NVQ සහතිකලාභී ශිල්පීන් සංඛ්‍යාව (28)	✓		
විදේශ රැකියා නිලධාරී					
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	i. විදේශගත වන අරමුණු සාක්ෂාත් කිරීමට සංවර්ධන සැලසුම් 10ක් ක්‍රියාත්මක කිරීම.	ක්‍රියාත්මක කළ සංවර්ධන සැලසුම් (27)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
(SDG 08) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	ii. විගමනික පවුල්වල සුබසාධනය සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.	ප්‍රතිලාභීන් (1688)			✓
	iii. විදේශ රැකියා අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීම් හා ප්‍රවර්ධන වැඩසටහන් 15ක් පැවැත්වීම.	පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් (23)			✓
	iv. පුහුණු ශ්‍රමිකයන් 200 ක් විදෙස් රැකියා වෙත යොමු කිරීම	විදේශගත කළ පුහුණු ශ්‍රමිකයන් (137)	✓		
	v. විදෙස් ගත ශ්‍රමිකයන් 25ක් නැවත නැවත විදෙස්ගත වීම වළක්වා සමාජගත කිරීමට සහය වීම.	නැවත සමාජගත කළ විදෙස් ගත ශ්‍රමිකයන් (13)			✓
	vi. මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම 12 ක් පැවැත්වීම	පවත්වන ලද රැස්වීම් ගණන (04)*			✓
* මැතිවරණ කාලසීමාව තුළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම හේතුවෙනි. (මැතිවරණ කොමිසන් සභාව විසින් නිකුත් කරන ලද EDR/PE/2024/P459 හා 2024.08.16 දිනැති ලිපිය)					
පරිසර නිලධාරී					
(SDG 15) භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණ, කාන්තාරීකරණය ට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම.	i. දිස්ත්‍රික්කයේ පැවැති පරිසර ගැටලු හා පරිසර සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කර ගැනීම සඳහා පරිසර කමිටු 06 ක් පැවැත්වීම.	පැවැත් වූ දිස්ත්‍රික් පරිසර කමිටු සංඛ්‍යාව (05)			✓
	ii. ඝන අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම මඟින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීමට කසළ කළමනාකරණ වැඩසටහන් 03ක් ක්‍රියාවට නැංවීම.	ක්‍රියාවට නැංවූ කසළ කළමනාකරණ වැඩසටහන් සංඛ්‍යාව (06)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
	iii. වන ගහනය වැඩි කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් 35 ක් ක්‍රියාවට නැංවීම.	ක්‍රියාවට නැංවූ රුක් රෝපණ වැඩසටහන් සංඛ්‍යාව (17) ක්‍රියාවට නැංවූ පරිසර සංරක්ෂණ වැඩසටහන් සංඛ්‍යාව (03)			✓
ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර					
(SDG 4.7) 2030 වන විට ඉගෙනුම් ලබන සියලුම දෙනා තිරසර සංවර්ධන ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවයන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවක්, මානව	i. රාජ්‍ය සේවකයන් හා පාසැල් හැරගිය දරුවන් සඳහා ද්විභාෂා දැනුම ලබාදීම පිණිස දෙමළ භාෂා පාඨමාලා 13 ක් සංවිධානය කිරීම. (සහභාගිත්වය 500)	භාෂා පාඨමාලාව සම්පූර්ණ කළ සංඛ්‍යාව (300)		✓	
අයිතිවාසිකම්, සාමය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම ඇතුළත් වේ.	ii. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ත්‍රෛ භාෂා පුරප්පාඩු අවම කිරීම සඳහා භාෂා පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ප්‍රමිතිගත ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. (06)	භාෂා පාඨමාලාව සම්පූර්ණ කරන ලද පුහුණු ගුරුවරු සංඛ්‍යාව (60)		✓	
	iii. බහු සංස්කෘතික වැඩසටහන් 06 ක් පැවැත්වීම.	සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සහභාගිත්වයෙන් පවත්වන ලද බහු සංස්කෘතික ව්‍යාපෘති (05)		✓	

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
	iv. තෝරාගත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා භාෂා සැලසුම් පහසුකරණ වැඩසටහන් පැවැත්වීම	ත්‍රෛභාෂා වෙන් රාජකාරි කිරීමට හැකියාව සහිත නිලධාරීන්		✓	
(SDG 4.4) 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය ක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුලුව අදාළ කුසලතා ලබා සිටින තරුනයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැන්වීම.	v. තෝරාගත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ යටතේ ඇති රාජ්‍ය ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා භාෂා සැලසුම් පහසු කරන වැඩසටහන් පැවැත්වීම.	ත්‍රෛභාෂාවෙන් රාජකාරී කිරීමට පහසුකම් සැලසීම.		✓	
දිස්ත්‍රික් සංස්කෘතික සංවර්ධන නිලධාරී					
(SDG 04) පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම.	i. හඳුනාගත් ජන ක්‍රීඩා 10 ක් දිස්ත්‍රික්කයේ ළමා සමාජ 13හි ළමුන් සඳහා පුහුණුව ලබාදීම.	පුහුණු වූ ළමුන් (700)			✓
	ii. දේශීය ආහාර, දේශීය වෛද්‍ය විද්‍යා ප්‍රවර්ධන වැඩසටහන් 20 ක් පාසල් දරුවන් හා කලාකරුවන් හා දෙමව්පියන් සඳහා පැවැත්වීම.	සහභාගි වූ සංඛ්‍යාව (1000)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
	iii. සාම්ප්‍රදායික කලා නිර්මාණ සඳහා වෙළඳපොලක් සකස් කරදීමට අළෙවි පොළ 04 ක් පැවැත්වීම. (ගොක්කොළ කලා, වෙස් මුහුණු කලාව, බතික් කලාව, පන් කලාව)	සහභාගි වූ අලෙවිකරුවන් සංඛ්‍යාව (20)		✓	
	iv. වාර්ෂිකව සංවිධානය කෙරෙන විවිධ ජාතීන්ට හා ආගම්වලට අනුකූල වන උත්සව 30 ක් සංවිධානය කිරීම.	සංවිධානය කළ උත්සව සංඛ්‍යාව (25)			✓
ආපදා සහන සේවා නිලධාරී					
(SDG 13) දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.	i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාම නිලධාරීන්, ආපදා සහන සේවා කමිටු සාමාජිකයින් හා ආපදා කළමනාකරණ කමිටු සාමාජිකයින් 200ක් දැනුවත් කිරීම.	දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වූ ගණන (180)		✓	
(SDG 13) දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.	ii. කඳවුරු කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් පැවැත්වීම.	පැවැත් වූ කඳවුරු සංඛ්‍යාව (04)		✓	
	iii. ආපදාවන්ට ඔරොත්තු දෙන නිවාස ව්‍යාපෘති 02ක වැඩ අවසන් කිරීම.	ඉදි කළ සුරක්ෂිත නිවාස සංඛ්‍යාව (01)			✓
	iv. ආපදා අවස්ථාවන්හිදී විපතට පත්වන පුද්ගලයින් ආරක්ෂිතව රඳවා තබා ගැනීමට සුදුසු වන පරිදි සුරක්ෂිත මධ්‍යස්ථාන 02ක් වැඩි දියුණු කිරීම.	වැඩි දියුණු කරන ලද සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව (02)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
ඵලදායිතා සංවර්ධන නිලධාරී					
(SDG 16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැඟීම.	i. ඵලදායිතා ප්‍රවර්ධන සංකල්ප ක්‍රියාත්මක කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන 15 ක් සවිබල ගැන්වීම.	• සකස් කළ තත්ත්ව විශ්ලේෂණ වාර්තා ගණන (35)			✓
		• වැඩ අධ්‍යයන (Work Study) ගණන (65)			✓
		• පවත්වන ලද ඵලදායිතා වැඩමුළු ගණන(72)			✓
		• දැනුවත් කළ ප්‍රතිලාභීන් ගණන (1276)			✓
		• පවත්වන ලද සේවාලාභී තෘප්ති සමීක්ෂණ ගණන (10)			✓
(SDG 16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම	ii. රාජ්‍ය ආයතනවල ක්‍රියාවලි 30 ක් වැඩි දියුණු කිරීම.	• ක්‍රියාවලි අධ්‍යයන ගණන (85) • පවත්වන ලද ඵලදායිතා වැඩමුළු ගණන (96) • සරල කළ ක්‍රියාවලීන් ගණන (30)			✓
ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැඟීම.	iii. පාසල් ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා 02ක් පැවැත්වීම.	• ඵලදායිතා සංකල්ප පිළිබඳව දැනුවත් කළ සිසුන් ගණන (80)			✓
	iv. ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 ක් පැවැත්වීම.	පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන (12)			✓
	v. ආයතනවල ඉල්ලීම් අනුව ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් 200 ක් පැවැත්වීම.	ආයතන වල ඉල්ලීම් අනුව පවත්වන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ගණන (206)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
උපදේශන අංශය					
(SDG 3.4) 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	i. තරුණ ප්‍රජාව මානසිකව සවිබල ගැන්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් උපදේශන වැඩසටහන් පැවැත්වීම (24)	මානසිකව සවිබල ගැන්වූ පවුල් (24)		✓	
	ii. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමන් උපදේශන සායන පැවැත්වීම (24)	උපදේශන සායන හා වැඩසටහන්(24)		✓	
	ii. සේවාලාභීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම (24)	දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව (24)		✓	
	iv. සේවාලාභීන් දිස්ත්‍රික් රැකියාපොළ වෙත යොමු කිරීම	යොමු කරන ලද සේවාලාභීන් සංඛ්‍යාව (20)		✓	
	v. විශේෂ මැදිහත්කරණය අවශ්‍ය සේවාලාභීන් සඳහා උපදේශන සේවා ලබාදීම	උපදේශන සේවා ලබාදුන් සේවාලාභීන් ගණන (60)		✓	
	vi. මාසිකව තේමාවක් බැගින් වසර තුළ දී තේමා 12 ක් යටතේ පවුලේ සාමාජිකයන් දැනුවත් කිරීම	දැනුවත් කළ අවස්ථා ගණන (221)		✓	
(SDG 3.4) 2030 වන විට බෝ නොවන රෝග නිසා….	vii. උපදේශන සායන මඟින් කණ්ඩායම් හා තනි පුද්ගල වශයෙන් සේවා සැපයීම	පවත්වන ල උපදේශන සායන ගණන (48)		✓	
සමථ පුහුණු නිලධාරී					
(SDG 16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට	i. සමථ මූල මණ්ඩල පුහුණුකිරීම සහ මූල මණ්ඩල සාමාජිකයන් පත් කිරීම .	සමථ මූල මණ්ඩල අළුත් කිරීම පිණිස පැවැත්වූ පුහුණු වැඩමුළු සංඛ්‍යාව (03)			✓
		ලබාදුන් නිර්දේශිත වාර්තා (90)			✓

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය %		
			0 - 49	50 -74	75 - 100
අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකටම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැංවීම.	ii. දිස්ත්‍රික් මූල්‍ය සමථ මූල මණ්ඩලයට සාමාජිකයින් තෝරා ගැනීමට කටයුතු කිරීම.	තෝරා ගත් සාමාජිකයින් සංඛ්‍යාව (40)			✓
	iii. ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් මූල මණඩල13 හි පවත්වා ගැනීම.	බාරදුන් වාර්තා (13*13)			✓
(SDG 16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකටම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැංවීම.	iv. සියළුම පාර්ශ්වයන්ට සාධාරණත්වය ලබාදීම සහ ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය පිළිබඳ සමථකරුවන් බඳවා ගැනීමේ දී අවධානය යොමු කිරීම පිණිස සම්මුඛ පරීක්ෂණවල ට සම්බන්ධ වීම.	සම්මුඛ පරීක්ෂණ හරහා තෝරා ගන්නා ලද සමථකරුවන් සංඛ්‍යාව (150)			✓
	v. සමථ මූල මණ්ඩල සාමාජිකයන්ගේ නුසුදුසු ක්‍රියා හේතුවෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මගින් විමසා ඇති පෙත්සම් 8 ක් සඳහා වාර්තා ලබාදීම.	කොමු කරන ලද වාර්තා සංඛ්‍යාව (08)			✓
	vi. ප්‍රගතිය සමාලෝචනය රැස්වීම් පැවැත්වීම	පැවැත් වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව (10)	✓		
	vii. පාසැල් දරුවන්ට සමථකරණය පිළිබඳ වැඩසටහන් පවත්වා සිසුන් දැනුවත් කිරීම.	දැනුවත් කරන ලද සිසුන් සංඛ්‍යාව. (500)		✓	
		සමථ ඒකක පිහිටුවන ලද පාසැල් සංඛ්‍යාව (20)		✓	
	viii. කොළඹ දිස්ත්‍රික් ඉඩම් සමථ මූල මණ්ඩලය සඳහා නව සාමාජිකයන් පත් කිරීම	පත් කර ගන්නා ලද නව සාමාජිකයින් සංඛ්‍යාව (06)			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න - ඉහත 02 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

6 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	ඇබෑර්තු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	73	57	16	-
තෘතියික	34	28	6	-
ද්විතියික	1316	1452	136	148 (224 - සං. නිලධාරී සේවය)
ප්‍රාථමික	146	132	14	-
එකතුව	**1569**	**1669**	**172**	**148**

6.2. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු. '000)		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1.	ආරක්ෂිත රිය ධාවනය සහ ආකල්ප සංවර්ධනය පිළිබඳව රියදුරන් සඳහා වන පුහුණු වැඩසටහන	31	2024 පෙබරවාරී 10 සහ 11 දෙදින	235,175.00	-	දේශීය	ආරක්ෂිත රිය ධාවනය සහ ආකල්ප සංවර්ධනය පිළිබඳව රියදුරන් හට මූලික දැනුම ලබා දීම
2.	දෙමළ භාෂාව	87	2024.03.25 දින සිට 2024.07.17 දින දක්වා	112,500.00	-	දේශීය	දෙවනභාෂා ප්‍රවීණතාවය ලබාගැනීම යටතේ ද්විතියික මට්ටමින් දෙමළ භාෂා ලිඛිත හා කථන හැකියාව වර්ධනය කරගැනීම
3.	කාර්යාල ක්‍රම (ලිපිගොනු පවත්වාගෙන යාම/ රාජකාරී කටයුතු ඉටු කිරීම/පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව)	76	2024.03.21	29,700.00		දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම

අනු අංකය	වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථආයෝජනය (රු. '000)		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
4.	විගණන කටයුතු පිළිබඳ පුහුණුව	72	2024.03.28	28,625.00	-	දේශීය	විගණන ක්‍රියාවලියේ දී ඇතිවන ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබා ගැනීම
5.	විගණන කටයුතු පිළිබඳ පුහුණුව	81	2024.04.09	29,210.00	-	දේශීය	විගණනක්‍රියාවලියේ දී ඇතිවන ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබා ගැනීම
6.	කාර්යාල ක්‍රම (ලිපිගොනු පවත්වාගෙන යාම/ රාජකාරී කටයුතු ඉටු කිරීම/පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව)	72	2024.04.04	28,115.00	-	දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම
7.	කාර්යාල ක්‍රම (ලිපිගොනු පවත්වාගෙන යාම/ රාජකාරී කටයුතු ඉටු කිරීම/පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව)	75	2024.04.05	31,150.00	-	දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම
8.	විගණන කටයුතු පිළිබඳ පුහුණුව	75	2024.04.09	29,210.00	-	දේශීය	විගණනක්‍රියාවලියේ දී ඇතිවන ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම

අනු අංකය	වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථආයෝජනය (රු. '000		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
9.	විවෘත හා වගකිවයුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	160	2024.05.14	46,490.00	-	දේශීය	රාජ්‍ය සේවකයකු ලෙස ඇති වගකීම සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම
10.	2024 නවක පත්වීම්ලාභී ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන	1080	2024.06.10 සිට 2024.07.02 දක්වා	347,178.00	-	දේශීය	රාජ්‍ය සේවකයකු ලෙස ග්‍රාම නිලධාරින්ට ඇති වගකීම සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම
11.	විගණන හා සංගණන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	105	2024.07.23	64,850.00	-	දේශීය	විගණන ක්‍රියාවලිය හා සංගණනයේදී ඇතිවන ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම
12.	පරිපාලන නිලධාරින් සඳහා වන වැඩසටහන	15	2024.07.24	13,395.00	-	දේශීය	රාජ්‍ය සේවකයකු ලෙස පරිපාලන නිලධාරින්ට ඇති වගකීම සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම
13.	රෙජිස්ට්‍රාර්වරුන් සඳහා වන පුහුණුව	150	2024.08.13	140,800.00	-	දේශීය	රෙජිස්ට්‍රාර් සේවය සම්බන්ධයෙන් අවශ්‍ය කරන දැනුම ලබාගැනීම
14.	රාජ්‍ය අංශය සයිබර් ප්‍රහාර වලින් ආරක්ෂා කර ගැනීම පිළිබඳ පුහුණුව	100	2024.12.12	83,344.00	-	දේශීය	නිලධාරීන් එදිනෙදා රාජකාරී කටයුතු සිදු කිරීමේ සයිබර් ප්‍රහාර වලින් ආරක්ෂා කර වීම සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීම

අනු අංකය	වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථආයෝජනය (රු. '000		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
15.	තොරතුරු තාක්ෂණ නිලධාරීන්ට අදාල පුහුණුව	35	2024.08.22	32,415.00	-	දේශීය	රාජකාරී කටයුතු සිදු කිරීමේ දී පැන නගින තාක්ෂණික ගැටලු සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීම

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

- මානව සම්පත සංවර්ධනය සිදුවීම.
- කාර්යක්ෂමතාවය සඳහා ඵලදායීතාවය ඉහළ නැංවීම.
- නව තාක්ෂණික දැනුම ලැබීම.
- නිලධාරීන්ගේ සන්නිවේදන කුසලතා ඉහළ නංවීම හා සේවයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම.

7 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නැත.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නැත.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014/05/11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තුමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.		අනුකූල නොවේ.	සෑම විගණන වාර්තාවක් සඳහා මාසයක් තුළ පිළිතුරු සපයන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දැනුවත් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර කිරීම	අනුකූල වේ.		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාළ නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම්	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1)ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම. එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය. භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබුනු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුව ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/ 2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියේ හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතන පිළිබඳ මහජනතාවගේ ප්‍රශංසා චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරක දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/ 2018 1 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛය 2,3 ඡේදය පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන **ඡේද** මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම්	අනුකූල වේ.		

ස්තූතියි...

අභියෝගාත්මක වසරක දී සපුරා ගන්නා ලද

සාධනීය ඉලක්ක පෙළගස්වමින්

මෙම වාර්තාව සැකසීමට අවශ්‍ය දත්ත හා තොරතුරු

ලබා දී දායකත්වය දැක් වූ

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ

අංශ ප්‍රධානීන් ඇතුලු සහය දුන් සියලුම දෙනාට

ස්තූතියි...

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. WPCG/CL/A/FA/DS/2024/22 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 30 දින

දිස්ත්‍රික් ලේකම්
කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-06) හි කෙරිගෙන යන වැඩ ලෙස පැවති ආරම්භක ශේෂය වූ රු.1,549,460,990 හි ඇතුලත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී දරනු ලැබූ රු.1,277,674,425ක ශේෂය ඉවත්කල පසු රු.271,786,566ක් වූ ඉතිරි ශේෂය හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ වියදම වූවත් දිස්ත්‍රික් ඉංජිනේරු අංශයේ තොරතුරු වලට අනුව එම වියදම රු.227,004,981ක් වූයෙන් රු.44,781,585ක නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය. තවද 2024 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශයේ පවතින හෝමාගම ගොඩනැගිලි ඉදිකිරීම් ශේෂය වූ රු.330,802,313 තුල ද එම නොසැසඳුනු වෙනස පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ මුරකුටිය ඉදිකිරීමට දරා තිබූ රු.1,991,277ක ශේෂය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිලි සංකීර්ණයේ 07වන මහලේ දිසාපති නිල කාමර පරිශ්‍රයේ CCTV කැමරා සවිකිරීම් වියදම වූ රු.162,375ක ශේෂය හා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යාල පරිශ්‍රය ඇලුමිනියම් පාර්ටිශන් කිරීම, ක්ෂේත්‍ර නිලධාරී අංශයේ සිවිලිම සවිකිරීම හා වැසිකිලි පද්ධතිය සකස් කිරීම යනාදි කටයුතු සඳහා දරා තිබූ එකතුව රු.20,655,555ක් වූ වියදමද, ඇතුළුව එකතු මූලධන වියදම් වූ රු.22,809,207ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත්ව නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ගණකාධිකාරිගේ අංක DSIT.CMD/ACC/022024/Fixed Assets හා 2024 අගෝස්තු 20 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් හඳුනා ගන්නා ලද ගිණුම්ගත කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි ප්‍රාදේශීය ලේකම්ගේ

අධීක්ෂණයෙන් යුතු තිදෙනෙකුගෙන් යුත් වත්කම් තක්සේරු කමිටුවක් පත්කර එමගින් තක්සේරු කර දළ තක්සේරුව ගිණුම්ගත කිරීම සඳහා උපදෙස් ලබාදී නිබුණද අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් සතු වූ සේවා පියස්/ ග්‍රාම නිලධාරී කාර්යාල ගොඩනැගිලි 50 ක් තක්සේරු කර 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුලත්කර නොතිබුණු අතර කැස්බෑව ප්‍රාදේශීය ලේකම් සතු ඇරව්වල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් සේවා පියස ප්‍රාදේශීය ලේකම් කාර්යාල තක්සේරු කමිටුව විසින් රු.මිලියන 11.8ක වටිනාකමකට තක්සේරු කර තිබුණද එම වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) වර්ග අඩි 13,446ක වපසරියකින් යුතු කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-06) ඇතුලත් කර නොමැති බව නිරීක්ෂණය වුවත් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල සීමාව තුල පමණක් මූලධන වැය විෂයන් 02 ක් මඟින් රු.12,466,438 ක වියදමක් දරා තිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් ආයතන අංශය විසින් 2025 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව වාහන 51ක් පවතින බවත් ඉන් වාහන 05ක් වෙනත් අමාත්‍යාංශවලින් අයිතිය පවරාගැනීමකින් තොරව පවතින බවත්, වාහන 46ක අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින බවත් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.180,644,288ක ශේෂය වාහන 42කට අදාළව හඳුනාගෙන තිබීමෙන් වාහන 04ක වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි.

1.6.2 මූල්‍ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.277,408,688 ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.277,243,688 ක් විය. මේ අනුව රු.165,000 ක වෙනසක් පැවතුණි.

(ආ) සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැනට සේවයෙහි නොමැති සේවකයන් 27 දෙනෙකුට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.2,952,648 ක් විය. ඉන් රු.401,705 කට අදාළ ණය ශේෂ 03ක්, වර්ෂ 5ක් හෝ ඊට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

1.6.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

2024 මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් වල ප්‍රවාහන උපාංග 42කට අදාලව රු.180,644,288ක ශේෂය සඳහා ඉදිරිපත් කරන ලද සිගාස් පරිගණක දත්ත වාර්තාවෙහි අදාළ ප්‍රවාහන උපාංග එකිනෙක වෙන් වෙන් වශයෙන් නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි තොරතුරු ඇතුලත්කර නොතිබුණි. ඊට අදාලව ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වාර්තාවෙහිද ප්‍රවාහන උපාංග 34කට අදාල තොරතුරු පමණක් ඇතුලත් කර තිබූ අතර එම ප්‍රවාහන උපාංග වලද වටිනාකම් සනාථ කිරීමට විධිමත් උපලේඛන හෝ තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.180,644,288ක ප්‍රවාහන උපාංග ශේෂය සනාථ කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි නොමැති විය.

1.6.4 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳව නිතිපතා පරීක්ෂා කළ හැකි වනු පිණිස අවශ්‍ය වන බැරකම් ලේඛනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 32 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.1,343,569,420 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,173,216,302 ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරි වීම් රු.170,353,118 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. මූලික හා පරිපූරක ඇස්තමේන්තු සැකසීමේ දී හා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් අයදුම් කිරීමේ දී සලකා බැලිය යුතු සියලුම නිර්නායක පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලකින් තොරව ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබූ අතර එමගින් එය පාලන කාරකයක් ලෙස ඵලදායීව යොදා ගැනීමට තිබූ අවස්ථාව මගහැරී ගොස් තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආකෘතියේ බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව අදාළ ගිණුම් වර්ෂය ඇතුලත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුල දී ඒ සඳහා අදාළ පාර්ශවයන්ට ගෙවීම් සිදු කර නොමැති ගනුදෙනු බැරකම් ලෙස හඳුනාගත යුතු වුවද, 2025 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳව සිදුකල නියැදි විගණන පරීක්ෂාවේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හඳුනාගත් එම කොන්දේසිය සපුරා ඇති වැය විෂයයන් 06 කට අදාළ රු.1,413,840 ක් බැරකම් ලෙස හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන	
(i)	XXIV පරිච්ඡේදයේ 4.4 වගන්ති	වසර 6 කට හා 3 කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුද ඇතුලුව මිය ගිය නිලධාරීන් 03 දෙනෙකුට අදාළ රු.526,396 ක ණය ශේෂයක් අදාළ

		විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකර ගෙන නොතිබුණි.
	(ii) XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.5, 4.6 හා 6.3 වගන්ති	නිලධාරියා විශ්‍රාම ගොස් වර්ෂ 10-20ත් අතර කාලයක් ගත වූ එක් අයෙකු හා වර්ෂ 1-3ත් අතර කාලයක් ගත වූ 03 දෙනෙකු ඇතුලුව විශ්‍රාමික නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.1,151,770 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකර ගෙන නොතිබුණි.
	(iii) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොගත් වැඩ තහනම් කරන ලද නිලධාරීන් 05 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.147,754 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයටත් පැවතුණි.
	(iv) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	තනතුර හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.357,445 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානයටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
	(i) මුදල් රෙගුලාසි 104(3) හා 104(4)	වාහන අනතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වඩා වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් පිළියෙල කළ යුතු අතර පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ දිනයේ සිට මාස 03ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද මොරටුව හා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් රජයේ වාහන 02 ක සිදුවූ අනතුරු සම්බන්ධයෙන් එම විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 177(2)	එකතු කරන නිලධාරීන් සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඔවුනට ලැබෙන සියළුම මුදල් හැකිතාක් ඉක්මණින් හෝ සෑම සතියකටම අඩුම තරමේ එක් වරක් බැගින් ප්‍රතිග්‍රාහක කාර්යාලයට යැවිය යුතුය. නමුත් හැඳුනුම්පත් ගාස්තු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප අංශය වෙත ඉදිරිපත් කිරීමේදී උක්ත විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කළ අවස්ථා කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවතුණි.
(iii)	මුදල් රෙගුලාසි 137 (5) හා මුදල් රෙගුලාසි 237 (iii) (ආ)	සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදි ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව අනුමත කිරීමේ නිලධාරියා විසින් තහවුරු කර ගත යුතු අතරම, ගෙවීම් වවුචරයක් පිළියෙල කිරීමේදි ගබඩාවට භාණ්ඩ ලැබී ඇති බවටද අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට සහතික විය යුතු වුවද එවැනි තහවුරුවක් නොමැතිව සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති අංක N248385831506 යටතේ සිදුකර තිබූ මිලදී ගැනීම වෙනුවෙන් 2024 සැප්තැම්බර් 28 දින චෙක්පත් අංක 684915 මඟින් රු.99,918 කට අදාළව ගෙවීම් වවුචර් පිළියෙල කර වැය ලෙජරයට ඇතුලත් කර ගිණුම්ගත කර තිබුණද 2025 ජනවාරි 06 වන විටත් අදාළ භාණ්ඩ ලැබී නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 571(3)	අදාළ විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතුය. නැතහොත් හැකි ඉක්මනින් ආපසු ගෙවිය යුතු වුවත් දෙහිවල හා කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(v)	මුදල් රෙගුලාසි 1645(ආ)	එක් එක් වාහනයේ රියදුරා ලවා 268 වැනි පොදු ආකෘති පත්‍රයේ ප්‍රකාර දෛනික ධාවන සටහනක් තබාගැනීමට සලස්වා පරිපාලක නිලධාරීන් ලවා එය නිතිපතා පරීක්ෂා කරවීම සිදු කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වාහන 09 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(vi)	මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දින ගතවන්නට පෙර 268(අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක වාහන 12 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛය - 10 ඡේදය	ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන්කරගෙන අවම වශයෙන් මාස 4කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු යෙදිය යුතුවේ. නමුත් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවන්ට අනුව මොරටුව, සිතාවක, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ)	අංක 05/2008 දරන 2008 පෙබරවාරි 6 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ආයතනයක් විසින් පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමේදී පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම, ඇගයීම හා වැඩි දියුණු කිරීම යන පියවරයන් ඉටු කළ යුතු අතර 2024 වර්ෂයේදී සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම, ක්‍රියාත්මක වීම, සහතික වීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගත් ක්‍රියාමාර්ගයන්

		විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර සීතාවක, මොරටුව, දෙහිවල, කොලොන්නාව හා මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර තිබුණද උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ බවට ප්‍රමාණවත් ලිඛිත තොරතුරුද පවත්වා නොතිබුණි.
(ඉ)	2019 මැයි 31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පාදුක්ක,හෝමාගම හා කඩුවෙල, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 921 ක් 2024 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණු අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 හි චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කළ යුතු විශ්‍රාම වැටුප් ලිපි ගොනු සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙනද නොතිබුණි.
(ඊ)	2019 මැයි 30 දිනැති අංක 02/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 06 ඡේදය	මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක 2024 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 485 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් සිදුකර තවදුරටත් අයකර ගත යුතු රු.46,728,917 ක මුදලක් පැවතුණි.
(උ)	අංක 30/2016 දරන 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 කාල පමාවකින් පසුව හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව යන කරුණු අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු වුවත්, විගණන නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 11කට අදාළව එසේ ඉන්ධන දහන පිළිබඳව කාලීන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
(ඌ)	2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	උක්ත චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිහරණය

		කරනු ලබන මෝටර් රථ 2ක හා යතුරුපැදි 03 ක ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි.
(ඒ)	2018 ඔක්තෝබර් 15 දිනැති අංක NSE/EL/01/2018 දරන සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.15 ඡේදය	කිසියම් දීමනාලාභියෙකු මාස 03ක් අඛණ්ඩව තම දීමනාව ලබා නොගත්තේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය කමිටුව මඟින් තීරණය කොට, අදාළ දීමනාලාභියාගේ නම, දීමනා ගෙවීම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වුවත් කොළඹ, දෙහිවල, මොරටුව හා සීතාවක යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.5 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු තැන්පත් ගිණුම් 8 ක රු.929,303,312 ක ශේෂයක් පැවති අතර ඒ අතුරින් පොදු තැන්පත් ගිණුම් 2 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු.27,954,311 ක තැන්පතු ශේෂයක් පැවතුණි. තවද එකී ශේෂය තුල එකතුව රු.16,710,707 ක් වූ වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ද විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව රු.18,319,695ක් වූ වැඩිහිටි දීමනා, රු.732,000 ක්වූ අබාධිත දීමනා, රු.50,000 ක්වූ ගංවතුර ආධාර සහ රු.92,095 ක නොගෙවූ දීමනා වශයෙන් අදාළ ප්‍රතිලාභීන් විසින් ලබා නොගත් දීමනා එකතුව රු.19,193,790ක් ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එවා තිබුණු අතර එම මුදල් ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු නොකොට තෙවන පාර්ශවයේ ගෙවීම් තැන්පත් ගිණුමේ මාස 01 - මාස 14 කාලයක සිට පැවතුණි. එම දීමනා ලබාගැනීම සඳහා අදාළ ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවේ නම් එම වර්ෂය තුලදීම අදාළ වැය විෂයන්වලට අධිභාර කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 394(ඇ) අනුව අවලංගු කළ චෙක්පත් වටිනාකම් කාර්යාලයට ලැබුනු මුදලක් සේ සලකා නියමිත ගිණුමට බැර කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව රු.762,288ක අවලංගු කළ චෙක්පත් වටිනාකම් තෙවන පාර්ශව පොදු තැන්පත් ගිණුමේ මාස 06 - මාස 32 කාලයක සිට රඳවාගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ පිටුම්පේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හා පාදුක්ක සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම(අදියර I), බෝමිරිය සමෘද්ධි නව ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර I), කැස්බෑව සමෘද්ධි නව ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර I) හා පැරෂුට් වගා ක්‍රමය ව්‍යාප්ත කිරීම සඳහා අක්කර ගණනට අවශ්‍ය වගා තැටි ලබා දීම සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ 2024 වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක 2024 සැප්තැම්බර් වන විටත් ගිවිසුම්ගතව හෝ වැඩ ආරම්භ කර නොතිබූ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 36 ක් සඳහා කොළඹ දිස්ත්‍රික්කය වෙත වෙන් කරන ලද රු.56,768,678ක ප්‍රතිපාදන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත නැවත පවරා දී තිබුණි.

(ඇ) විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන යටතේ 2024 වර්ෂයට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක අනුමත ප්‍රතිපාදන රු.349,670,107කට අදාළ ව්‍යාපෘති 127ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව වැය විෂය අංක 255-01-01-00-2104 යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.95,300,000ක ප්‍රතිපාදන ලබාදී තිබුණද රු.36,284,252ක් එනම් සියයට 38ක් උපයෝජනය කර නොතිබුණි.

4.1.2 කමිටු ක්‍රියාකාරිත්වය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන විවිධ කමිටු අතරින් කමිටු 05 ක ක්‍රියාකාරිත්වයට අදාල 2021 පෙබරවාරි 12 දිනැති රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2021 අනුව සෑම මසකට වරක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව රැස් විය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එය වාර 06 ක් පමණක් රැස් වී තිබුණු අතර, දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව වර්ෂයකට 12 වරක් රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එය වාර 02 ක් පමණක් පවත්වා තිබිය දී සෑම මසකටම වරක් රැස් විය යුතු ප්‍රාදේශීය ලේකම් සමුළුව වසර තුළ රැස් වී තිබුණේ වාර 09 ක් පමණි. තවද මසකට වරක් බැගින් පැවැත්විය යුතු දිස්ත්‍රික් නිවාස කමිටුව ද සමාලෝචිත වර්ෂය තුළ රැස් වී තිබුණේ එක් වරක් පමණක් විය. එසේම වසරක් තුළ මසකට වරක් බැගින් පැවත්විය යුතු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ද සමාලෝචිත වර්ෂය තුළ රැස් වී තිබුණු වාර 06 ක් පමණක් විය. ඒ අනුව දිස්ත්‍රික්කය තුළ ඵලදායී, අර්ථවත් සේවාවක් පුරවැසියන් වෙත සැපයීම සඳහා යෝජිත කමිටුවල නිසි හා කාලීන ක්‍රියාකාරිත්වය අතිශය වැදගත් වන නමුත් එම කමිටුවල කාලීන ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි. තවද කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව තුල වසර ගණනාවක සිට ප්‍රධාන කාර්යයක් වශයෙන් දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල ජනතාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම යනුවෙන් සඳහන්ව තිබුණද වර්තමානයේ දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවක් නොපවතින බවත් එය යුද්ධය පැවති සමයේ ආරම්භ කරන ලද්දක් බවත් නිරීක්ෂණය වූ අතර යුද්ධය අවසන් වී අදාළ කමිටුව අක්‍රිය වී තිබුණද එම කාර්යය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයක් ලෙස දිගින් දිගටම දක්වා තිබුණි.

4.1.3 අඩක් නිම් ගොඩනැගිලි

මහරගම, කඩුවෙල, කෝට්ටේ, සීතාවක හා හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුල අඩක් නිම් ගොඩනැගිලි 25ක් පැවති අතර ගොඩනැගිලි 20ක් සඳහා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු.32,209,846 ක මුදලක් වැය කර තිබුණි. අදාළ ගොඩනැගිලි බහුතරයක ඉදිකිරීම්වලින් කොටසක් පමණක් නිමකර, දීර්ඝ කාලයක් තිස්සේ එම ගොඩනැගිලිවල ඉතිරි කොටස් සම්පූර්ණ කිරීමකින් තොරව පැවති අතර භාවිතයට නොගන්නා ඇතැම් ගොඩනැගිලි ප්‍රදේශයේ විවිධ සමාජ විරෝධී ක්‍රියා සඳහා යොදවා ගන්නා ස්ථාන බවට පත්වෙමින් පැවති බවටද වාර්තා වී තිබුණි. මෙම සියලුම ගොඩනැගිලි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අදාළ ගොඩනැගිලි භාවිතයට ගතහැකි මට්ටම දක්වා අවසන් කිරීමට නොහැකි වීම මත අඩක් නිම් තත්ත්වයේ පැවති බවත් මෙම ගොඩනැගිලි භාවිතයට ගත හැකි පරිදි කොටසක් හෝ සම්පූර්ණයෙන් නිම කළ යුතු බවත් නිරීක්ෂණය කෙරේ.

4.1.4 ඌන උපයෝජිත වත්කම්.

ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ සමිති 124 ක් ලියාපදිංචි කර තිබූණද 2024 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 90 ක් අක්‍රීයව පැවතුණි. එදිනට අක්‍රීය සමිති වලට අදාළ ග්‍රාම ශක්ති මව් සමිති ගිණුමෙහි රු.31,882,213ක් ද ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ රු.277,921 ක් වශයෙන් බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.32,160,134 ක මුදල් ඌන උපයෝජිතව පැවතුණි.

4.1.5 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු. 2,542,627ක වියදමින් සීතාවක පශු නිෂ්පාදන ගම්මාන සමිතියේ සාමාජිකයන් 28 දෙනෙකු වෙත එළු පැටවුන්, කුකුළු පැටවුන් ලබා දීම .කුකුළු කූඩු හා ගව ගාල් සකසා දීම කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රයක් යනාදී උපකරණ ලබා දී තිබුණද ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත ලබාදුන් රු. 1,301,750ක වටිනා සතුන්, එම උපකරණ 2024 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිතව පැවතුණි. තවද ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත ලබා දෙන ලද එළුවන් 12 දෙනෙකු යම් යම් රෝග හේතුවෙන් මිය ගොස් තිබූ බව දක්වා තිබුණු අතර මෙම සතුන් මියයෑම පිළිබඳ කිසිදු පශු වෛද්‍ය වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. එසේම ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත ලබා දෙන එළුවන් 07 දෙනෙකු අදාළ ප්‍රතිලාභීන් විසින් විකුණා තිබුණද එම ප්‍රතිලාභීන් වෙතින් ගිවිසුම් ප්‍රකාරව අදාළ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 07ත් පසුව මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පරීක්ෂා කළ බවට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු නොතිබුණි. කිරි හා බිත්තර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, අගය එකතු කළ නිෂ්පාදන ධාරිතාව ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමේ පරමාර්ථ ඇතිව ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මඟින් අගය එකතුකිරීමේ කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන හෙයින් සීතාවක සෞභාග්‍යා පශු ගම්මානයක් ඇති කිරීමේ ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලභාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ළඟිරුගම වසමේ සීතාවක සෞභාග්‍යා පශු ගම්මාන ප්‍රතිලාභීන්ට හට පුහුණු හා අලෙවි ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් ලෙස අඩක් නිම කර තිබූ ඇල්ල කන්ද ශාලාව රු. 1,286,159ක මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කළ නමුත් සීතාවක සෞභාග්‍යා පශු ගම්මාන ව්‍යාපෘතිය අසාර්ථක

විම මත වර්තමානයේදී එම ගොඩනැගිල්ල එය නිම කිරීමේ අරමුණ වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සමිතියේ යටතේ ලබාදී තිබුණු වටිනාකම රු.5,000,000ක් වූ මාළු වියලන යන්ත්‍ර 04 න් 02ක් නිෂ්පාදනය සඳහා භාවිතා නොකිරීම හේතුවෙන් බෙරුවල විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඉතිරිව පැවති රු.2,500,000ක වටිනාකමින් යුතු මාළු වියලන යන්ත්‍ර 02කද උපයෝජනය කර නොතිබුණු අතර මාළු වියලන යන්ත්‍ර සමිති වෙත ලබා දීමේදී සෞභාග්‍යා කාර්යාංශය මඟින් හඳුන්වා දෙන ලද ආදර්ශ ගිවිසුම් ආකෘතිය අනුව ගිවිසුම් ගත වී නොතිබීම හේතුවෙන් එම ගිවිසුම් ආකෘතියේ අඩංගු වැදගත් මෙන්ම බලාත්මක කොන්දේසි හා අත්‍යාවශ්‍ය කරුණු ඇතුලත් නොකර ගිවිසුම් ගත වී තිබුණි. වෙරළාසන්න ප්‍රදේශයේ ජීවත්වන ධීවර ජනතාවගේ මාළු අස්වැන්න වැඩිකර ගැනීම, අල්ලා ගනු ලබන අතිරික්ත මාළු ප්‍රමාණය තාක්ෂණය යොදා ගෙන කරවල උම්බලකඩ සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා දැනුම ලබා දීම තුළින් අතිරික්ත ආදායමක් ලබා ගැනීමේ පරමාර්ථ ඇතිව ආරම්භ කළ මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ සමාලෝචිත වර්ෂය අවසානයටත් ලබාගෙන නොතිබුණි.

(ඈ) මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ලබා දී තිබූ මාළු වියලන යන්ත්‍රය ස්ථාපනය කිරීම සඳහා රු. 2,926,723 ක වියදමින් මොරටුවැල්ල බටහිර වසමේ පිහිටි අතහැර දමා තිබූ ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර වසර තුනකට අධික කාලයක් ගත වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ගොඩනැගිල්ල සඳහා විදුලි පහසුකම් නොතිබුණි. තවද මෙම ගොඩනැගිල්ල තුල නිෂ්පාදන කටයුතු සිදු කර ගෙන යාම සඳහා අදාළ සෞභාග්‍යා ධීවර සමිතිය වෙත ලබා දීමේදී ඇතිකර ගෙන තිබූ අවබෝධතා ගිවිසුම විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මාළු වියලන යන්ත්‍ර ස්ථාපනය කිරීම හා සෞභාග්‍යා සමිති පැවැත්වීම අරමුණු කර ගනිමින් ප්‍රතිසංස්කරණය කළද සමාලෝචිත වර්ෂය අවසානයට මෙම ගොඩනැගිල්ල අදාළ අරමුණු සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

(ඉ) මොරටුව ලී බඩු සැකසීමේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ 2021 දෙසැම්බර් මස අදාළ සමිතිය වෙත භාර දෙන ලද සැන්ඩර් මැෂින් 40 ක් මකිටා වර්ගය (Sander machine- Makita brand) අදාළ ප්‍රදේශයේ වෙසෙන වඩුකාර්මිකයන් සුලභව භාවිතා කරන හා වැඩි ඉල්ලුමක් පවතින උපකරණ පිළිබඳව නිසි සැළකිල්ලක්

නොදක්වා මිලදී ගැනීම හේතුවෙන් අදාළ සැන්ඩර් මැෂින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඊ) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ කාබනික පොහොර සහ කිරි ගොවි නිෂ්පාදන ගම්මාන දෙකකට අදාළව පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා නගර සභාවට අයත් කොරතොට බෝගහවත්ත පොදු පහසුකම් ඉඩමේ කාබනික පොහොර අලෙවි කිරීම ඇතුළු සමිතියේ ප්‍රචර්ධන කටයුතු සඳහා ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,926,829ක් ද කිරි නිෂ්පාදන අලෙවි කිරීම ඇතුළු සමිතියේ ප්‍රචර්ධන කටයුතු සඳහා නගර සභාව සතු ඉඩමෙහි පිහිටි වැලිහිඳ ගොඩනැගිල්ලේ පහත මහලේ වැඩ නිමකිරීම වෙනුවෙන් රු.2,926,829ක් ද වශයෙන් රු.5,853,658ක් වියදම් කරමින් 2021 දෙසැම්බර් 25 දින මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර තිබූ නමුත් එම ව්‍යාපෘති අසාර්ථක වීම මත සමාලෝචිත වර්ෂය අවසානයටත් මෙම ගොඩනැගිලි දෙක එකී ගොඩනැගිලි ඉදිකිරීමේ මූලික අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි.

4 .1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඒ ඒ අංශයන්හි ක්‍රියාකරකම් 2024 වර්ෂය තුළදී ළඟා කර ගැනීම පිළිබඳ වූ සැලසුම් අංශය මඟින් ඉදිරිපත් කළ සමස්ත ප්‍රගතිය හා 2024 වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබූ ඒ ඒ අංශයන්ගේ අදාළ ක්‍රියාකරකම් ඉටුකරගැනීමේ ප්‍රගතිය පරීක්ෂාවේදී අංශ 03ක, ක්‍රියාකාරකම් 06ක ප්‍රගතිය එකිනෙකට වෙනස් අගයක් ගෙන තිබූ අතර ක්‍රමසම්පාදන අංශයේ ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ ලියාපදිංචි කරන ලද සමිති 124 න් 2024 දෙසැම්බර් 31 දිනට සමිති 90 ක්ම අක්‍රීයව පැවතියද එම වැඩසටහනහි සියයට 90ත් - 100 ත් අතර ප්‍රගතියක් වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබීම මතභේදාත්මක කරුණක් විය. තවද වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාව තුල එක් එක් පරිච්ඡේදයන්හි 2024 වර්ෂයේ දුරියන් වගාව පිහිටුවීමේ අක්කර ප්‍රමාණය හා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2024 වර්ෂයේ බඳවා ගත් ප්‍රමාණය පිළිබඳව දක්වා තිබූ ප්‍රගතිය එකිනෙකට වෙනස් විය. මේ හේතුවෙන් සත්‍ය ප්‍රගතිය හඳුනාගැනීම අපහසු කාර්යයක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් යම් යම් අංශයන්හි ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

4 .2 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 51 අතරින් 2024 දෙසැම්බර් 31 දිනට අලුත්වැඩියාව සඳහා යොමුකර ඇති ධාවන තත්ත්වයේ නොපවතින වාහන 08ක් පැවති අතර එම වාහන මාස 03 සිට මාස 45ක කාලසීමාවක සිට ධාවන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට වාහන 05 ක අයිතිය දිස්ත්‍රික් ලේකම් නමට පවරාගෙන නොතිබුණු අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විගණනයට ලද තොරතුරු ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී තිබූ වාහන 13 ක් දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොපවතින අතර එම වාහන පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිහරණය කළ මෝටර් රථයක් 2021 අගෝස්තු 24 දින ඇති වූ කාර්මික දෝෂය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවා රු.497,075කට අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී බව යාන්ත්‍රික ඉන්ජිනේරුවරයා විසින් 2021 සැප්තැම්බර් 21 දින නිර්දේශ කර තිබිය දී එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 03කට අධික කාලයක් තිස්සේ අනාරක්ෂිතව, අව් වැසිවලට නිරාවරණය වෙමින් එළිමහන් ස්ථානයක ගාල්කර තිබුණි.

(ඇ) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2021 මැයි 13 දින ඩබල් කැබ් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණි. එම රථය දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත 2021 මැයි 17 දින රු.905,480ක් වැය කරමින් අලුත්වැඩියාව සිදුකිරීමේදී ප්‍රධානම මෙහෙයුම් ඒකකය වන එන්ජිමෙහි සහ ගියර් පද්ධතියේ ක්‍රියාකාරිත්වය, පැවැත්ම සහ පවතින දෝෂයන් පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව අනිකුත් අලුත්වැඩියාවන් සිදුකිරීම යෝග්‍යද යන්න සලකා බැලිය යුතු වුවත් එසේ කිරීමකින් තොරව මොටර් රථයේ සිසිලන, වායුසමීකරණ, තිරිංග පද්ධතීන්වල සහ මෝටර් රථයේ බෙදෙහි තීන්ත පින්තාරු කිරීම් වැනි අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. එසේ අලුත්වැඩියාව සිදු කර වසරක් ගතවීමට පෙර මෙම මෝටර් රථයේ එන්ජිමෙහි සහ ගියර් පද්ධතියේ පවතින දෝෂයන් හේතුවෙන් අපහරණය කිරීම සඳහා නිර්දේශ කර තිබීමෙන් මෙම රථය අලුත් වැඩියා කිරීම සඳහා වැය කළ මුදල් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඈ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෝටර් රථයක ඉන්ධන ධාරිතාවය ඉන්ධන ලීටර් 55ක් ලෙස දක්වා තිබුණු නමුත් 2023 නොවැම්බර් 20 සිට 2024 සැප්තැම්බර් 30 දක්වා ඉදිරිපත් කර තිබූ ධාවන සටහන්වල ලීටර් 789ත් 846ත් අතර ඉන්ධන ප්‍රමාණයන්

ඉන්ධන ටැංකියේ ඉතිරිය ලෙස දක්වා තිබුණි. ධාවන සටහන් අනුව මෙලෙස ඉන්ධන ටැංකියේ ඉතිරියක් ලෙස අසාමන්‍ය ඉන්ධන ලීටර් ප්‍රමාණයක් පැවතීමට හේතුවූ කරුණු අනාවරණය කරගැනීමකින් තොරව මාස 10කට අධික කාලයක් අඛණ්ඩව ඉන්ධන ලබා දීම සිදු කර තිබුණි. තවද අධික ලෙස සුදු දුම් පිටවීම හේතුවෙන් අලුත්වැඩියාවන් සිදුකර, එම අලුත්වැඩියාවන් සිදුකල බවට තාක්ෂණික නිලධාරියාගේ නිර්දේශය 2023 දෙසැම්බර් 27 දිනැතිව ඉදිරිපත් කර ඒ සඳහා 2023 දෙසැම්බර් 28 දින රු.787,750ක් සහ රු.461,500ක් වශයෙන් එකතුව රු.1,249,250ක් ගෙවීම් සිදු කර තිබුණු නමුත් මෙම මෝටර් රථයේ ධාවන සටහන් අනුව 2023 දෙසැම්බර් 09 දින මෝටර් රථය අලුත්වැඩියාව සඳහා යොමු කර ඇති අතර අලුත්වැඩියාව නිමකර නැවත මෝටර් රථය ධාවනය සඳහා යොදා ගෙන තිබුණේ 2024 මාර්තු 12 දිනදීය. ඒ අනුව එම අලුත්වැඩියාව අවසන්වීමට පෙර ගෙවීම් සිදුකර තිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිහරණය කළ මෝටර් රථයක් සඳහා රු.1,158,950ක් වැය කර වසරක වගකීම් කාලයකට යටත්ව 2022 දෙසැම්බර් 20 දින අලුත්වැඩියාවක් සිදුකර 2023 ජූලි 28 දින දක්වා කි. මී. 3,435ක් පමණක් ධාවනය කර තිබූ අතර එදිනෙන් පසුව ධාවනය නොවීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. තවද උක්ත අලුත්වැඩියාවට අදාළ වගකීම් කාලසීමාව අවසන් වූ පසුව එනම් 2024 මාර්තු 03 දින කාර්මික දෝෂයක් සම්බන්ධයෙන් වාර්තා කර තිබුණි. ඒ අනුව වගකීම් කාල සීමාව තුල නිසි පරිදි ධාවනය නොවීම මත වගකීම් කාලසීමාව තුලදී ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ අහිමි වීමක් නිරීක්ෂණය වූ අතර 2025 අප්‍රේල් 21 දින වන විටත් එනම් මාස 20කට අධික කාලයක සිට මෙම වාහනය ධාවනයට යොදාගැනීමකින් තොරව අලුත් වැඩියාව සඳහා යොමුකර තිබුණි.

4.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2024 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 12 කට අධික කාලයක් ගත වී තිබුණද මේ සම්බන්ධයෙන් විමර්ශණ අවසන් වී නොතිබීමෙන් එම හානි අයකර ගැනීම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණු අතර හානියේ වටිනාකම රු.92,606,688 ක් විය.

(ආ) විශ්‍රාම වැටුප් ගෙවීමේදි මූලික වැටුප වැඩිපුර ගෙවීම, පාරිතෝෂික මුදල් වැඩිපුර ගෙවීම, ජීවන වියදම් දීමනාව, අන්තර් දීමනාව, යැපීම් දීමනා වැනි දීමනා වැඩිපුර ගෙවීම, විශ්‍රාම වැටුප් වක්‍රලේඛවලට අනුගත නොවී වැඩිපුර ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන් 181

දෙනෙකුට එලෙස වැඩියෙන් ගෙවා, 2024 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අයවිය යුතු රු.29,752,987 ක් පැවති අතර ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක විශ්‍රාමිකයන් 12 දෙනෙකුගෙන් මියයාම හෝ වෙනත් හේතු මත අය නොවන ලෙස හඳුනා ගෙන තිබූ මුදල රු.2,458,613 ක් විය.

(ඇ) සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රාදේශයේ 2016 ජුනි 05 දින සාලාව යුධ හමුදා කඳවුරේ හදිසි පිපිරීම හේතුවෙන් හානි වූ 427 ඒ සාලාව ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පුද්ගලයකුගේ නිවස සඳහා රු. 3,635,000ක් වූ පළමු තක්සේරුව, 2016 සැප්තැම්බර් 23 දිනැති තක්සේරුව මඟින් රු.1,500,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එම සංශෝධිත තක්සේරුව 2016 සැප්තැම්බර් 26 දින සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු නමුත් පෙර තක්සේරුව මත පදනම්ව එවකට සේවයේ නියුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල මත රු. 3,635,000 ක් ගෙවීම හේතුවෙන් උක්ත සඳහන් පුද්ගලයා වෙත රු. 2,006,872 ක මුදලක් වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි. තවද 2025 පෙබරවාරි 03 දිනට උක්ත සිදුවීම සිදු වී වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණද රු.2,006,872ක් වූ වැඩිපුර ගෙවීම අදාළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු මෝටර් රථයක් 2024 සැප්තැම්බර් මස 20 අනතුරට ලක්වී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එම හානියේ ඇස්තමේන්තු වටිනාකම හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන තුල තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු යටතේ දක්වා නොතිබුණි. තවද මු.රෙ.104 ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව , අවසන් වාර්තාව යනාදිය තොරතුරු ඇතුලත් ලිපිගොනුව 2025 අප්‍රේල් වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ, දෙහිවල, කොලොන්නාව, රත්මලාන ,සීතාවක, මොරටුව සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකි වී තිබුණි.

(ආ) සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාළ කුලී ආදායම දිගුකාලයක් සිට අයකර ගෙන නොතිබූ අතර උසාවි නියෝගයට අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විශ්‍රාමිකයන් 125 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.16,236,922 ක මුදලක් එසේ ගෙවා තිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයන් 202ක් සඳහා තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු මඟින් සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.58,974,495 ක මුදලක් ගෙවා තිබුණි. මෙම තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ගොනු 64 ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 13ක් තුල වැඩිහිටි දීමනා ගෙවීම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරුවලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල වැඩිහිටි දීමනා වශයෙන් ගෙවීමට නියමිත වූ මුදල රු.934,711,700 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රු.147,971,400 ක අධිභාර මුදලක් පැවතුණි.රත්මලාන හා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2024 වර්ෂයේ පොරොත්තු වැඩිහිටි දීමනා සම්බන්ධයෙන් අධිභාර හඳුනාගෙන නොතිබුණි.

(ඉ) කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 13 තුල අනවසරයෙන් අල්ලාගෙන තිබුණු ඉඩම් කැබලි සංඛ්‍යාව 596 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක පමණක් ඉඩම් කච්චේරි 06ක් පවත්වා සීතාවක හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02හි පමණක් බලපත්‍ර 12 ක් ලබා දී තිබුණි. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 හි 2024 ජනවාරි 01 දිනට අනවසරයෙන් අල්ලාගත් ඉඩම් කැබලි 594 ක් පැවතිය ද සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කැබලි කිසිවක් නියමානුකූල කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් කැබලි 973 ක් පැවතුණි.

(ඊ) අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ සහල් බෙදාහැරීම යටතේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත බෙදා දීමට ලබාදුන් සහල් 10 Kg ක් බැගින් වූ බෑග් 82 ක් දෙමටගොඩ හා කොළොන්නාව වසම් භාර ග්‍රාම නිලධාරී විසින් අවධිමත් ලෙස ගබඩාකිරීම හේතුවෙන් මිනිස් පරිභෝජනයට ගත නොහැකි අකාරයෙන් නරක් වී තිබුණි. මේ පිළිබඳ මූලික විමර්ශනයක් පවත්වන ලෙස 2024 මැයි 28 දින පැවැත් වූ

ප්‍රාදේශීය ලේකම් සමුළුවේදී, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද එම මූලික විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි.

(උ) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැපැල් කාර්යාල 02ක 2024 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස වෙනුවෙන් නොගෙවූ වැඩිහිටි දීමනා රු.2,396,500ක් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට අදාළ තැපැල් කාර්යාලවලට ලිපි යොමු කිරීමට මාස 05 කට වැඩි කාලයක් ගතකර තිබීම හේතුවෙන් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් අනවශ්‍ය ලෙස තැපැල් කර්යාලවල රඳවා ගැනීමට ඉඩ සලසා දීමක් සිදුවන බවද, නොගෙවන ලද වැඩිහිටි දීමනා ආපසු ගෙන්වාගැනීමට සහ ප්‍රතිලාභීන් විසින් දීමනාව ලබා නොගැනීමට හේතු වූ කරුණු පරීක්ෂාකර ප්‍රතිලාභීන්ට ගෙවීම් සිදු කිරීමට හෝ ප්‍රතිලාභීන් දීමනාව ලබාගැනීමට ඉදිරිපත් නොවේ නම් ප්‍රතිලාභී ලේඛන යාවත්කාලීන කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

(ඌ) ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා වගාවට සුදුසු රජයේ ඉඩම් හා ඌන උපයෝජිත රජයේ ඉඩම් කෙටිකාලීන බෝග වගාවන් සඳහා යොදා ගැනීම පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2022 ජුනි 20 දිනැති අංක 2022/06 දරන චක්‍රලේඛය ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඌන උපයෝජිත පර්චස් 620ක රජයේ ඉඩම් ප්‍රමාණය වගා කිරීමට සුදුසු වගාකරුවන් තෝරා ගැනීම සඳහා වගාකරුවන් ලියාපදිංචි කිරීම, මෙම වැඩසටහන පිළිබඳව විධිමත්ව වගාකරුවන් දැනුවත් කිරීම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණු අතර 2025 ජනවාරි 05 දින දක්වා කිසිදු ඉඩමක් උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කෙටිකාලීන බෝග වගාවන් සඳහා ලබාදී නොතිබුණි. ඒ අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උක්ත චක්‍රලේඛයෙන් අරමුණු කර තිබූ ශ්‍රී ලංකාව තුළ උද්ගතවෙමින් පවතින ආහාර අර්බුදයට විසඳුම් ලෙස ඌන උපයෝජිත රජයේ ඉඩම් සුදුසු බෝග වගාවන් සඳහා කඩිනමින් ලබාදීම මගින් රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම හා සුදුසු වගාකරුවන්ට ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(එ) නායයෑම් අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකර නැවත පදිංචි කිරීම යටතේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයෙන් ලබාදුන් ඉඩමක නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු.1,200,000 ක ප්‍රතිලාභ ගෙවීම යටතේ පුද්ගලයන් 09 දෙනෙකු තෝරා ගෙන තිබුණද ඔවුන්ගෙන් 07 දෙනෙකුට පමණක් රජයේ ඉඩමක නිවාස ඉදිකිරීම සඳහා 2023 දෙසැම්බර් 19 දින පළමු වන වාරිකය ලෙස එකතුව රු.3,500,000 ක්ද එක් ප්‍රතිලාභියෙකු වෙත දෙවන වාරික මුදල් ලෙස

රු.400,000 ක්ද ගෙවා තිබුණි. එසේ ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කර වසරක කාලයක් ඉක්ම ගොස් තිබුණද එම ඉදිකිරීම් කටයුතු ප්‍රගතිය සම්බන්ධයෙන් 2025 ජනවාරි වනවිටත් පසුවිපරමක් සිදු කල බවට තොරතුරු ගොනුව තුල නොතිබුණු අතර නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන දෙවන වාරිකය මුදා හැරීමට අධීක්ෂණ පත්‍රිකාව යටතේ සිදුකල යුතු පරීක්ෂා වලින් තොරව 2024 සැප්තැම්බර් 06 වන දින එක් ප්‍රතිලාභියෙකු වෙත දෙවන වාරිකය ලෙස රු.400,000 ක් ගෙවා තිබුණි.

ප්‍රතිලාභියා මිලදී ගත් හෝ ප්‍රතිලාභියා සතු ඉඩමක නිවාස ඉදිකිරීම යටතේ පුද්ගලයන් 07 දෙනෙකු වෙත නිවාස ඉදිකිරීම සඳහා සිව්වන වාරිකය දක්වා රැඳවුම් මුදලද ඇතුළුව එකතුව රු.8,400,000ක් ද නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීමට රු.1,600,000 ක් ගෙවීම යටතේ ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත රු.6,400,000 ක් ගෙවා තිබුණද එම සියලුම ප්‍රතිලාභීන් වෙත රජයෙන් ලබාදුන් මුදල යොදා මිලදී ගත් ඉඩමේ පත්ඉරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත පැවරීම සඳහා මෙතෙක් නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය ලබා දී නොමැති බව නිරීක්ෂණය වූ අතර මෙම කාර්යාලය සඳහා යෝජිත ටෙලිකොම් ඉඩමේ ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ලේ මහල් 03 ක් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය භුක්තිය වෙනුවෙන් භාරදීමට නියමිතව තිබුණද, එහි කිසිදු ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි.

(ඔ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක pen/pol/06/15 - 2023 හා 2024 ජූනි 14 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 07/2023 (සංශෝධන II) ප්‍රකාරව - 2024 වර්ෂය සඳහා 2024 ජූනි 30 දිනට ජීවිත සහතික යාවත්කාලීන කර නොමැති විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප ගෙවීම 2024 ජූලි මස සිට අත්හිටුවන ලදී. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9ක එලෙස 2024 ජූලි මස විශ්‍රාම වැටුප නතර කරන ලද විශ්‍රාමිකයන් 122 දෙනෙකු සිටින අතර මෙම විශ්‍රාමිකයන් මිය ගොස්ද , පදිංචිය හැර ගොස් තිබේද , විදේශ ගතවී තිබේද යන්න පිළිබඳ 2025 මාර්තු 31 දක්වා තොරතුරු සොයා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඕ) කොළඹ දිස්ත්‍රික් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අත්හැර දැමූ ගොඩනැගිලි 30 ක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතා නොකිරීම නිසා දිරාපත් වීමට ලක්වෙමින් පවතිණ අතර එම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 20 ක්ම අලුත්වැඩියා හෝ නවීකරණයෙන් පසු නැවත භාවිතා කල හැකි මට්ටමේ පවතිණ නමුත් මේ දක්වා ඒ පිළිබඳ අවධානය යොමු වී නොතිබුණි.

5. තිරසර සංවර්ධනය

(අ) තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන ගැනීම පිළිබඳ 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 32 කට අදාළව තිරසර සංවර්ධන අරමුණු 12 ක් යටතේ දර්ශක 203ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 11ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද දර්ශක 47ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවති අතර දර්ශක 02ක ඉලක්කයන්ට අදාළව ළඟා කර ගත් ප්‍රගතිය දක්වා නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී 2024 වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබූ ඉලක්ක/දර්ශක 09ක් 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර නොතිබීම හේතුවෙන් ඒවාට අදාළ 2024 වර්ෂයේ ඉලක්කය කොපමණද යන්න තහවුරුවක් නොවූ හෙයින් එම දර්ශක සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය විගණනයට මැනිය නොහැකි විය.

(ඇ) 2024 වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබූ තිරසර සංවර්ධන අරමුණුවලට ඉලක්ක 03 ක ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කරන ලද අනෙකුත් වාර්තාවන්හි සඳහන් ප්‍රගතිය සමඟ එකිනෙකට වෙනස් වූ අතර 2024 වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාවේ දක්වා තිබූ තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු මත නිවැරදි තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

6. යහපාලනය

6.1 මහජනතාව වෙත සේවා ඉටුකිරීම.

මහජනතාව දෛනිකව නිරන්තරයෙන් සේවා ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2020 ජනවාරි 24 දිනැති ස්වදේශ කටයුතු ගිණුම් චක්‍රලේඛ අංක 02/2018(II) මඟින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී තිබුණු අතර, ඒ අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2024 වර්ෂයේ මහජනතාව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් වැඩිපුරම රාජකාරි ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන සේවාවන් අතරින් වැඩිම ඉල්ලුමක් ඇති සේවාවන් 05 ක් හඳුනාගැනීම හා ඒ සඳහා අදාළ ඉලක්කයන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබාගැනීම පිළිබඳව අංක WPCG/CL/A/INFO/2025/වි.තො.04 හා 2025 ජනවාරි 23 දිනැති ලිපිය මඟින් තොරතුරු ඉල්ලුම් කළ නමුත් 2025 අප්‍රේල් 22 දින දක්වා එම තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තවද සීතාවක, මොරටුව, දෙහිවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේදී ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම, 2024 වර්ෂයේ අදාළ ඉලක්කයන් ලබාදීම හා ප්‍රගතිය මැන බැලීම සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. ඉහත චක්‍රලේඛයට අනුව 2024 වර්ෂය සඳහා මහජනතාව වැඩිපුරම පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීමත් හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනීමත් සිදු කර නොතිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් 07 ක හා කළමනාකරණ සේවා නිලධාරියෙකුගෙන් සමන්විත විය. සමාලෝචිත වර්ෂයේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13හි විගණනය වෙත ඉදිරිපත් නොවූ වවුචර් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු එම අංශය තුල නොතිබීම හේතුවෙන් විගණනය වෙත ඉදිරිපත් නොවූ වවුචර් පවතීද යන්න පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	73	57	17	01
තෘතියික මට්ටම	34	28	06	-
ද්විතියික මට්ටම	1,873	1,929	41	97
ප්‍රාථමික මට්ටම	145	132	13	-
එකතුව	2,125	2,146	77	98

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2,125ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 2,146ක් වූ අතර ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 77 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 98ක් විය. සංවර්ධන නිළධාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 757 ක් වුවද එම සේවයේ තත්‍ය සේවක සංඛ්‍යාව 1041 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 284 ක් විය. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 123 ක් හා ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 80 ක් නිරීක්ෂණය වූයෙන් එය මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකි විය.

(ආ) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරියක සඳහා 2020 පෙබරවාරි 13 දිනැති අංක දි.ලේ/කොා/ක්‍රම/25/සං නි/වි.නි දරන ලිපියෙන් 2019 සැප්තැම්බර් 04 දින සිට 2022 සැප්තැම්බර් 03 දින දක්වා වැටුප් රහිතව වර්ෂ 03 ක කාලසීමාවක් සඳහා විදේශ ගැකියා නිවාඩු සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර, 2022 සැප්තැම්බර් 04 දින නැවත සේවයට වාර්තා කළ යුතුව තිබුණද මෙම නිලධාරිනිය එම දිනයේ සේවයට වාර්තා කර නොතිබුණු හෙයින් 2019 අගෝස්තු 20 දින මැය සමඟ ඇති කරගන්නා ආයතන සංග්‍රහයේ 16.5 වගන්තියේ 10 වැනි

පරිශිෂ්ඨය ප්‍රකාරව අත්සන් කරන ලද ගිවිසුමෙහි IV වගන්තියේ සඳහන් වන නැවත සේවයට වාර්තා නොකළහොත් ගෙවිය යුතු රු.675,136ක් වූ දණ්ඩන මුදලින් රු.200,000ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට රාජකාරී කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක අනිවාර්ය නිවාඩු ගැන්වූ සේවකයින් 07 දෙනෙකු හා වැඩ තහනම් කළ එක් සේවකයකු වෙත වර්ෂ 2017 - 2024 කාලසීමාව තුල වැටුප් හා දීමනා ලෙස රු.8,880,468 ක් ගෙවා තිබුණු අතර එසේම සේවකයින් දෙදෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු.164,290 ක මුදලක්ද පැවති අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක අල්ලස් චෝදනා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ ග්‍රාම නිලධාරීන් තිදෙනෙකු අනිවාර්ය නිවාඩු මත සිටියදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා තිබූ අතර එම නිලධාරීන් සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,615,529ක මුදලක් ගෙවා තිබූ අතර එක් නිලධාරියෙකුගෙන් රජයට රු.97,500ක මුදලක් අයවීමට තිබුණි.

(ඉ) ආයතන සංග්‍රාහයේ XLIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය සංශෝධනය මැයෙන් 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි යම් චෝදනාවකට ලක් වුවන් සම්බන්ධයෙන් මාස දෙකක් ඇතුළත දී මූලික විමර්ශණයක් පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක වූදිත නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පැවැත්වීම සඳහා මාස 04 ත් මාස 48ත් අතර කාල සීමාවක් ගත කර තිබුණි.

(ඊ) සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කළ නිලධාරියකු අල්ලස් චෝදනා මත අනිවාර්ය නිවාඩු ගන්වා 2012 මැයි 03 දින රාජකාරී වැඩ තහනම් කර තිබුණි. මෙම නිලධාරියා සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ පනතේ 19 (ආ) සහ සංශෝධිත පනතේ 19(ඇ) ප්‍රකාරව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීරණය අනුව 2019 ජනවාරි 15 දින චිත්තිකරු වැරදිකරු කර තිබූ අතර නිලධාරියා විසින් කොළඹ මහ අධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබුණුද එයින්ද ඔහු වැරදිකරුවෙක් ලෙස තීරණය ලබා දී තිබුණි. මෙම නිලධාරියා සම්බන්ධයෙන් පවත්වනු ලැබූ නඩු විභාගයෙන් ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ තීරණය, මහ අධිකරණයේ තීරණය, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 22 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් නිලධාරියාට එරෙහිව පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයෙන්ද

ඔහුට එරෙහිව නඟා ඇති සියලු චෝදනා සඳහා වැරදිකරු ලෙස තීරණය කළ ද ඔහු ලබා ගෙන ඇති තුටු පඬුරේ ස්වභාවයත්,ඔහුට එරෙහිව පෙර වැරදි නොමැති වීමත් ,වසර 12කට අධික කාලයක් රාජකාරී වැඩ තහනමකට ලක් වී තිබීමත් යන කරුණු සැලකිල්ලට ගෙන මොහු 2024 මැයි 15 දින රාජකාරී වැඩ තහනමට ලක්වූ කාල සීමාවට වැටුප් ගෙවීමකින් තොරව දිස්ත්‍රික් ලේකම් විසින් නැවත වරක් සේවයේ පිහිටුවා තිබුණි.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම්ගෙන් කරුණු ඉදිරිපත් කරන ලෙස දක්වා තිබූ අතර එයට පිළිතුරු ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් 2025 පෙබරවාරි 13 දිනැති අංක DIST,CMB/ES/09/D-04 ලිපිය මඟින් ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන සානුකම්පිතව සිතා බලා නැවත සේවයේ පිහිට වූ බවත්, නිලධාරියා වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත අනුයුක්ත කිරීම යෝග්‍ය බවටත් කරුණු දක්වා තිබුණි.

(උ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වසර 05ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරුවල/ සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථානමාරු ලබාදිය යුතු වුවද, ඊට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක 2024 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 55 දෙනෙකු සේවය කරමින් පැවතුණි.

(ඌ) 2024 වර්ෂය සඳහා මානව සංවර්ධන සැලැස්මක් සකස් කර තිබුණද එහි ඒ ඒ තනතුරට අදාළ රාජකාරී වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටු කරලීම සඳහා අදාළ නිලධාරීන්ට තිබිය යුතු මූලික නිපුණතා හා තාක්ෂණික නිපුණතා හඳුනා ගෙන මානව සංවර්ධන සැලැස්මෙහි අන්තර්ගත කළ යුතු වුවද තනතුරු 07කට අදාළව තාක්ෂණික නිපුණතා හඳුනාගෙන නොතිබුණු අතර විධායක තනතුරු 07ක් සඳහා කාර්යයන් ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු තාක්ෂණික නිපුණතා ලෙස මෘදුකාංග පිළිබඳ දැනුම පමණක් සඳහන් කර තිබුණි. තවද ඒ ඒ තනතුරු වලට අදාළව තවදුරටත් නිපුණතා පරතරය පිරවීම උදෙසා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කර පුහුණු සැලැස්ම පිළියෙල කළ යුතු වුවද එලෙස පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීමකින් තොරව පුහුණු සැලැස්ම පිළියෙල කර තිබුණි.

(එ) 2024 මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල නිපුණතා පරතරය පිරවීම් සඳහා සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් 10න් පුහුණු වැඩසටහන් 02ක් හැර සේවකයන්ගේ ධාරිතාව හා අභිප්‍රේරණය ඉහළ නැංවීම සඳහා නිරන්තරයෙන් අවශ්‍යවන සැලසුම් කළ විෂයානුබද්ධ අනෙකුත් පුහුණු වැඩසටහන් 07ක් 2024 වර්ෂයේදී පවත්වා නොතිබුණි. එසේම කාර්යාලයේ සෑම සාමාජිකයකු සඳහා ම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ආයතනයේ මානව සංවර්ධන සැලැස්ම තුල සහතික විය යුතු වුවද විගණනය වෙත ඉදිරිපත් කළ 2024 පුහුණු ප්‍රගතිය අනුව තනතුරු 02ක නිලධාරීන් සඳහා කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

priyadarshanic

එස්.ඒ.ඩී.සී. ප්‍රියදර්ශනී

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

එස්.ඒ.ඩී.සී. ප්‍රියදර්ශනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

